Lanka Phosphate Limited

# ලංකා පොස්පේට් ලිමිටඩ්

## වාර්ෂික වාර්තාව 2024 / 2025




කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

## දැක්ම

“ එප්පාවල පොස්පේට් නිධිය ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් පොස්පරස් පෝෂක මගින් අපගේ මාතෘභූමියේ සාරවත් පසක් නිර්මාණය කිරීම ”






## මෙහෙවර

“ පරිසර හිතකාමී සහ නව ක්‍රියාවලියක් හරහා පොස්පරස් වලින් ස්වයංපෝෂිත වෙමින් ජාතික පොස්පේට් අවශ්‍යතාවය සපුරා ලීම ”

# පටුන


- හැඳින්වීම 01
- අධ්‍යක්ෂ මණ්ඩලය 02
- කළමණාකරණ කණ්ඩායම 03-04
- සභාපතිවරයාගේ ප්‍රකාශය 05
- අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 06-08
- මෙහෙයුම් ක්‍රියාවලි සමාලෝචනය 2024 /2025 09-13
- පසුගිය වසර 10 ක මූල්‍ය තොරතුරු 14
- ආයතනික පාලන වාර්තාව 15 -17
- විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව 18
- විගණකවරුන්ගේ වාර්තාව 19 -25
- මූල්‍ය ප්‍රකාශන
  - කාල පරිච්ඡේදය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 26
  - 2025.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 27
  - කාල පරිච්ඡේදය සඳහා ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය 28
  - කාල පරිච්ඡේදය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය 29
  - මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සටහන් 30-44
  - ආයතනික තොරතුරු , සැළකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන් ඇස්තමේන්තු උපකල්පන 45-53
- රැස්වීම පිළිබඳ දැණුම් දීම 54
- පෙරකලාසියේ ආකෘතිය 55

**සමාගමේ නම**

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම (PB308)

**පිහිටි ස්ථානය හා නීතිමය ස්වරූපය**

සී /ස ලංකා පොස්පේට් ආයතනය 1992 ජූලි මස 10 වන දින සීමිත වගකීමක් සහිත සමාගමක් වශයෙන් 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ ස්ථාපිත කරන ලද්දේ රාජ්‍ය කැණීම් හා ඛනිජ සංවර්ධන සංස්ථාවේ එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය ලෙස 1987 අංක 23 දරණ පොදු සංස්ථා හෝ රජයට අයිතිය පවරා ගන්නා ව්‍යාපාර පොදු සමාගම් වශයෙන් පරිවර්තනය කිරීමේ පනත යටතේය. කෙසේ නමුත් 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ මෙකී සමාගම නැවත ලියාපදිංචි කරනු ලැබ ඇත.

**මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය**

බහු වාර්ෂික කෘෂිභෝග සඳහා පොහොර වශයෙන් යොදවන පාෂාණ පොස්පේට් කැනීම් කිරීම, සැකසුම හා අලෙවි කිරීම සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

**අධ්‍යක්ෂ මණ්ඩලය**

| | |
|---|---|
| එන් පී ඩී එස් ඒ ප්‍රේමකුමාර මහතා | - සභාපති |
| ජේ පී පී ලියනගේ මිය | - අධ්‍යක්ෂ |
| මහාචාර්ය ආර් එස් ධර්මකීර්ති මහතා | - අධ්‍යක්ෂ |
| ආචාර්ය සංජය ප්‍රනාන්දු මහතා | - අධ්‍යක්ෂ |
| එම් ජයතුංග මහත්මිය | - අධ්‍යක්ෂ |
| ඒ කේ අනිල් මහතා | - අධ්‍යක්ෂ |
| ජේ පී එන් ඒකනායක මහතා | - අධ්‍යක්ෂ |

**සමාගමේ ලේකම්**

එච් එල් විපුල එස් ඊ සිල්වා
**Attorney at Law**
නො. **618 – 1-1** , ගාලු පාර,
කොළඹ 03

**අවසාන මව් සමාගම**

ශ්‍රී ලංකාවේ රජය වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්ට මෙම සමාගමේ නිකුත් කළ කොටස් පිළිබඳව සම්පූර්ණ අයිතිය ඇත.

**රේඛීය අමාත්‍යාංශය**

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය,
තැ පෙ 570 , නො 73 /1 ,
ගාලු පාර,
කොළඹ 03

**ලියාපදිංචි කාර්යාලය**

අංක 73 1/1 , නව කැළණි පාලම පාර,
කොළඹ 14.
දුරකතන අංකය :- 0112459906 /7
ෆැක්ස් අංකය :- 0112459908

**විගණකකරු**

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
නො. 306/72 , පොල්දූව පාර ,
බත්තරමුල්ල.

**බදු උපදේශකවරු**

අමරසේකර සහ සමාගම,
වරලත් ගණකාධිකාරීවරු,
නො. 12 , රොටුන්ඩා උද්‍යානය,
කොළඹ 03.

**බැංකුකරුවන්**

ලංකා බැංකුව
මහජන බැංකුව
ජාතික ඉතිරිකිරීමේ බැංකුව

## අධ්‍යක්ෂ මණ්ඩලය



එන් පී ඩී එස් ඒ ප්‍රේමකුමාර මහතා
සභාපති



ජේ පී පී ලියනගේ මිය
අධ්‍යක්ෂක



මහාචාර්ය ආර් එස් ධර්මකීර්ති මහතා
අධ්‍යක්ෂ



ආචාර්ය සංජය ප්‍රනාන්දු මහතා
අධ්‍යක්ෂක



එම් ජයතුංග මහත්මිය
අධ්‍යක්ෂක



ඒ කේ අනිල් මහතා
අධ්‍යක්ෂක



ජේ පී එන් ඒකනායක මහතා
අධ්‍යක්ෂ

## කළමනාකරණ මණ්ඩලය



යූ ඒ දයානන්ද මහතා
සාමාන්‍යාධිකාරී



ආර් එම් පී කරුණාරත්න මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී



ඩී ජී යූ චාමර මහතා
මුදල් කළමණාකාර

මෙහෙයුම් කළමණාකාර



එම් එම් ඩී තිලකරත්න මහතා
මානව සම්පත් කළමණාකාර



කපිතාන් කේ ජී ආර් පී කිරිඇල්ල මහතා
ආරක්ෂක කළමණාකාර



ඩී බී කිරියවත්ත මහතා
අභ්‍යන්තර විගණක



ආර් ඒ ඒ පී රණසිංහ මහතා
අලෙවි විධායක



එල් එල් ඩී අයි පැතුම් මහතා
නිෂ්පාදන ඉංජිනේරු



ඒ එම් සනත් බණ්ඩාර මහතා
යාන්ත්‍රික ඉංජිනේරු

සැපයුම් නිලධාරී



එම් ඒ ආර් කේ මංචනායක මහතා ආ
කාර්ය මණ්ඩල නිලධාරී
( පරිපාලන හා මානව සම්පත් )



ඩී ආර් ගුණරත්න මහතා
කම්හල් නිලධාරී



ඩී එස් එම් දිසානායක මහතා
ගබඩා නිලධාරී



ඩී එස් සී කේ දෙහිවත්ත මහතා
පර්යේෂණ හා සංවර්ධන නිලධාරී

## සභාපතිවරයාගේ ප්‍රකාශය

ලෝක පොස්පේට් සංචිත සීමාසහිත වන අතර නැවත ජනනය නොවේ. එම නිසා ඒවා උපරිම හා තිරසාර ක්‍රියාවලියක් තුළ ප්‍රයෝජනයට ගත යුතුයි. ලෝකයේ පොහොසත්ම සහ අසම සම පොස්පේට් නිධියක් ලෙස සළකන ශ්‍රී ලංකාවේ පොස්පේට් සංචිතය 33% - 40% ක පමණ $P_2O_5$ ඛණිජ අඩංගු වේ. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය (GSMB) විසින් මෑතකදී ප්‍රසිද්ධියට පත් කරන ලද ප්‍රකාශයට අනුව , නිධියේ මෙට්‍රික් ටොන් මිලියන 31.5 ක ප්‍රමාණයක් කැණීම් කළ හැකි බවට ඇස්තමේන්තු කර ඇත. එප්පාවල රොක් පොස්පේට් නිෂ්පාදනය වාර්ෂිකව මෙට්‍රික් ටොන් 50,000 ක් වන හෙයින් ශ්‍රී ලංකාවේ පොස්පේට් අවශ්‍යතාවය වසර 600 ක පමණ කාලයක් පොස්පේට් නිධියෙන් සපුරා ලිය හැකි වේ.

වර්තමානයේ සමාගම විසින් එප්පාවල රොක් පොස්පේට් ( ERP ) සහ අධි ශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් ( HERP ) යනුවෙන් රොක් පොස්පේට් වර්ග දෙකක් නිපදවනු ලබන අතර මේවා ශ්‍රී ලංකාවේ බහු වාර්ෂික බෝග සඳහා පොහොර ලෙස භාවිතා කරනු ලැබේ.

2024 / 2025 මූල්‍ය වර්ෂය අවසානයේ සමාගම රු. මිලියන 1,215 ක දළ පිරිවැටුමක් අත් කර ගත් අතර එය පසුගිය වසරේ රු. මිලියන 1,080 ක පිරිවැටුමේ අඛණ්ඩ වර්ධනයකි. මේ සඳහා විදේශීය වෙළඳපල ඉලක්ක කර ගනිමින් මිලදී ගත් ගණුදෙනුකරුවන් / සමාගම් සඳහා අධිශ්‍රේණියේ එප්පාවල පොස්පේට් අලෙවි කිරීම කැපී පෙනෙන සාධකයක් වී ඇත. ඒ අනුව සමාගම රුපියල් මිලියන 364.6 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කර ඇති අතර එය රු. මිලියන 239.6 ක් වූ පසුගිය වසරට වඩා සාපේක්ෂව 52% ක වැඩි වීමකි.

ලංකා පොස්පේට් සමාගම බදු පෙර ලාභය ( Profit Before Tax - PBT ) රු. මිලියන 465.5 ක් වාර්තා කළ අතර එයට රු මිලියන 100.9 ක පොලී ආදායමක් ද ඇතුළත් වේ.

රජයේ ප්‍රතිපත්තියට අනුව ලංකා පොස්පේට් සමාගම විසින් , අගය එකතු කළ පොහොර නිෂ්පාදනයන් හඳුන්වා දීම හා මිලියන ගණනාවක් වූ විදේශීය විනිමය රට තුළ රඳවා ගැනීම සඳහා ප්‍රමුඛ හා තීරාණාත්මක කාර්ය භාරයක් කළ යුතුව ඇත.

වර්තමානය වන විට ආනයනික ත්‍රිත්ව සුපර් පොස්පේට් ( TSP ) වෙනුවට සිංගල් සුපර් පොස්පේට් ( SSP ) නිෂ්පාදනය හඳුනාගෙන ඇති අතර , එහි මූලික පියවරක් ලෙස දේශීය වෙළඳපලට සිංගල් සුපර් පොස්පේට් නිෂ්පාදනය කිරීම සඳහා දේශීය පාර්ශවකරුවෙකු ලෙස ලංකෙම් මිනරල් සමාගමට වාර්ෂිකව පොස්පේට් මෙට්‍රික් ටොන් 36,000 ක් ලබා දීමට ගිවිසුම් ගතව ඇත.

එප්පාවල පොස්පේට් නිධියේ උපරිම ප්‍රයෝජනය ලබා ගැනීමට අදාලව, පවත්නා හා නව ව්‍යාපාරික අවස්ථා දියුණු කිරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටී.

අවසාන වශයෙන් , මේ සම්බන්ධයෙන් අප වෙත මග පෙන්වීම , ධෛර්යය , සහයෝගය හා දේශපාලන නායකත්වය ලබා දෙන කර්මාන්ත අමාත්‍යාංශයට , මහා භාණ්ඩාගාරයට සහ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ ප්‍රණාමය පුද කරමි.

**එන් පී ඩී එස් ඒ ප්‍රේමකුමාර මහතා**
**සභාපති - ලංකා පොස්පේට් සමාගම**

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

සී /ස ලංකා පොස්පේට් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද ගිණුම් සහ 2025 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරයි.

## 1.0 සමාගමේ නම

සී /ස ලංකා පොස්පේට් සමාගම ( ලි ප අ PB308 )

## 2.0 පිහිටි ස්ථානය හා නීතිමය ස්වරූපය

රාජ්‍ය පතල් හා ඛණිජ සංවර්ධන සංස්ථාවෙහි එප්පාවල පොස්පේට් ව්‍යාපෘතිය පවරා ගැනීම සඳහා 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර පොදු සමාගම් බවට පත්කිරීමේ පනතට අනුව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සීමාසහිත ලංකා පොස්පේට් සමාගම සීමාසහිත වගකීම් සහිත සමාගමක් වශයෙන් 1992 ජූලි 10 වන දින සංස්ථාගත කරන ලදී. කෙසේ නමුත් මෙම ආයතනය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියා පදිංචි කරනු ලැබීය.

## 3.0 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ බහු වාර්ෂික කෘෂිකාර්මික භෝග සඳහා පොහොර වශයෙන් යොදා ගන්නා පොස්පේට් කැනීම් සිදු කිරීම , සකස් කිරීම හා අලෙවි කිරීමයි.

## 4.0 මූල්‍ය ප්‍රකාශනය

මේ සමඟ අමුණා ඇති මූල්‍ය ප්‍රකාශනයෙන් වාර්තා කරන දිනට සමාගමේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පෙන්නුම් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය තෘප්තිමත්ව සිටී.

මෙම මූල්‍ය ප්‍රකාශනය සැකසීමේ දී සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගී කර ගනිමින් ඒවාට අනුරූපව , සාධාරණව සහ ඒකාකාරීව නිගමන හා තක්සේරු කිරීම් සිදු කොට ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි. මෙම වාර්තාවේ අනාවරණය කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සැළකිය යුතු වෙනසක් සිදු වී නොමැති බව ඔවුන්ගේ අදහසයි. සමාගමේ අධ්‍යක්ෂවරු විසින් වත්කම් වල සුරක්ෂිතභාවය රැක ගැනීමටත් , වංචා සහ අනෙකුත් විධිමත් කටයුතු වළක්වා ගැනීමට සහ අනාවරණය කර ගැනීමටත් පියවර ගෙන ඇත.

## 5.0 මූල්‍ය ප්‍රකාශන සහ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී ගනුදෙනුවේ ස්වභාවය සහ හරය මනාව පිළිඹිබු වන පරිදි එයට අදාල විනිශ්චයන් සහ ඇස්තමේන්තුවලට සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් තෝරා ගෙන ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සැළකිලිමත් විය.

## 6.0 දේපල , පිරියත හා උපකරණ ඒවායේ ගණනය කිරීම් සඳහා ක්ෂය වීම්

වසර සඳහා දේපල , පිරියත සහ උපකරණ සඳහා ආයෝජනය රු. 4,942,205 .00 කි.

දේපළ පිරියත හා උපකරණ වල තත්ත්වය සහ චලනයන් ඒවායේ තක්සේරු කිරීම සහ ක්ෂය වීම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් අංක 5.0 හි දක්වා ඇත.

## 7.0 බදුකරණය

පිරිවැටුමෙන් 18 % ක එකතු කළ අගය මත බද්දට (VAT ) අමතරව ව්‍යාපාර සහ අනෙකුත් ආදායම් සඳහා සමාගමට 30% ක බදු වගකීමක් ඇත. ඒ අනුව 2024/25 වර්ෂය සඳහා මුළු වැට් බදු මුදල ගෙවීම රු මිලියන 144.0 ක් වේ.

## 8.0 ලාභාංශ

2023/24 වසර සඳහා රුපියල් මිලියන 100 ක ලාභාංශ ප්‍රකාශ කොට ගෙවා ඇත.

## 9.0 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමේ මුළු ප්‍රකාශිත ප්‍රාග්ධනය වූ රුපියල් 72,510,000/-, සාමාන්‍ය කොටස් 7,251,000 කින් සමන්විත වේ. සමාලෝචනයට භාජනය කරන වසර ඇතුළත ප්‍රකාශිත ප්‍රාග්ධනයේ වෙනසක් සිදු වී නොමැත.

## 10.0 කොටස් හිමිකාරීත්වය

1987අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රාජ්‍ය සතු ව්‍යාපාර පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ 2(3) වගන්තියට අනුව එකම කොටස්කරු වනුයේ රජය වෙනුවෙන් ( නිල වශයෙන්) භාණ්ඩාගාරික ලේකම්ය.
2025 මාර්තු 31 දිනට සමාගමේ කොටස් හිමිකාරීත්වය පිළිබඳ විස්තර පහත සඳහන් වන පරිදි වේ.
භාණ්ඩාගාර ලේකම්ට ( නිල වශයෙන් ) සාමාන්‍ය කොටස් 7,251,000 කි.

සී / ස GSMB ටෙක්නිකල් සර්විස් පුද්ගලික සමාගමේ කොටස්කරුවෙක් වන සී / ස ලංකා පොස්පේට් සමාගම සාමාන්‍ය කොටස් 100,000 ක හිමිකාරීත්වයක් දරයි . ( එකක් රු. 10/- බැගින් )

මෙහි හිමිකාරීත්වය දැරීමේ ප්‍රතිශතය 16.66% කි.

## 11.0 කොටස් හිමිකාරීත්වයේ වෙනස්වීම

සමාගමේ කොටස් හිමිකාරීත්වයේ කිසිදු වෙනස් වීමක් 2025 මාර්තු 31 දින වන විට සිදුවී නැත.

## 12.0 සංස්ථාපිත සමාජ වගකීම

සමාලෝචනයට භාජනය වූ වසර තුළ පුණ්‍ය කටයුතු සහ ආයතනික සමාජ වගකීම් සඳහා සමාගම විසින් සැළකිය යුතු දායකත්වයක් ලබා දී නොමැත.

## 13.0 සේවකයින්

වර්ෂය ඇතුළත සම්පූර්ණ සේවක මණ්ඩලය පිරිවැය රුපියල් 439,895,755/- කි. වර්ෂය අවසානය වන විට සමාගම විසින් සේවයේ යොදවා ඇති සාමාන්‍ය සේවක සංඛ්‍යාව 291 ක් වේ.

## 14.0 අධ්‍යක්ෂකවරුන්

සමාලෝචිත වසර අවසන් වන විට පහත සඳහන් අය අධ්‍යක්ෂ තනතුරු දැරිය.

| | |
|---|---|
| එන් පී ඩී එස් ඒ ප්‍රේමකුමාර මහතා | - සභාපති |
| ජේ පී පී ලියනගේ මිය | - අධ්‍යක්ෂ |
| මහාචාර්ය ආර් එස් ධර්මකීර්ති මහතා | - අධ්‍යක්ෂ |
| ආචාර්ය සංජය ප්‍රනාන්දු මහතා | - අධ්‍යක්ෂ |
| මනෝහාරි ජයතුංග මහත්මිය | - අධ්‍යක්ෂ |
| ඒ කේ අනිල් මහතා | - අධ්‍යක්ෂ |
| ජේ පී එන් ඒකනායක මහතා | - අධ්‍යක්ෂ |

## 15.0 අධ්‍යක්ෂවරුන් පත්වීම හා ඉල්ලා අස්වීම

ජී ඒ එම් එස් පී අඹන්වෙල මහත්මිය - සභාපති, ජී ඩබ් එම් යූ ෆොන්සේකා මහත්මිය - අධ්‍යක්ෂ , එල් ඒ එස් ලියනාරච්චි මහතා - අධ්‍යක්ෂ , කේ ඩී එස් අබේපාල මහතා - අධ්‍යක්ෂ , එල් එන් පී පෙරේරා මහතා -අධ්‍යක්ෂ ,වසර තුළ ඉල්ලා අස්වූ අතර,ඩී එම් බී පී ජයතිලක මහතා - අධ්‍යක්ෂ වසරේ දී අභාවප්‍රාප්ත වූ අතර එන් පී ඩී එස් ප්‍රේමකුමාර මහතා - සභාපති , ජේ පී පී ලියනගේ මහත්මිය - අධ්‍යක්ෂ , මහාචාර්ය ආර් එස් ධර්මකීර්ති මහතා - අධ්‍යක්ෂ , ආචාර්ය සංජය ප්‍රනාන්දු මහතා - අධ්‍යක්ෂ , මනෝරි ජයතුංග මහත්මිය - අධ්‍යක්ෂ, ඒ කේ අනිල් මහතා - අධ්‍යක්ෂ ,ජේ පී එන් ඒකනායක මහතා - අධ්‍යක්ෂ, වර්ෂය තුළ අළුතින් පත් කරන ලදී .

## 16.0 අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික සහ වියදම

සමාලෝචිත වර්ෂය ඇතුළත රුපියල් 3,170,075/- ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩලයේ දීමනා හා වියදම් වශයෙන් ගෙවා ඇත.

## 17.0 ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ උපරිම දැනීමේ සහ විශ්වාසය අනුව රජයට , සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම නිවැරදිව සහ නියමිත දිනට කර ඇත.

## 18.0 අනුකූල වීම

සමාගම ශ්‍රී ලංකාවේ හෝ අන්තැනකට අදාල නීති රීති හෝ රෙගුලාසි වලට පටහැනි ක්‍රියාකාරකම්වල නිරත වී නොමැත.

## 19.0 අඛණ්ඩ පැවැත්ම

සමාගමේ මෙහෙයුම් කටයුතු ඉදිරි අනාගත කාලයක් දක්වා පවත්වාගෙන යැමට ප්‍රමාණවත් සම්පත් ව්‍යාපාරය සතුව පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය තෘප්තිමත්ව සිටින අතර ඒ අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙළ කර ඇත. ඒ පිළිබඳ හෙළිදරව්වක් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් යටතේ දක්වා ඇත.

## 20.0 <u>සංස්ථාපිත පාලනය</u>

අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගත් සංස්ථාමය පාලනයක් සහතික කර ඇත. පොදු ව්‍යාපාරයක් වශයෙන් කොටස්කරුවන්ගේ අපේක්ෂා සහ අරමුණු මෙන් ම සමාගමේ අරමුණුවලට සමාන්තරව එහි කාර්ය සාධනය පවත්වාගෙන යාම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි.

## 21.0 <u>අවධානම් කළමණාකරණය</u>

සමාගම විසින් නීතිමය අවදානම අඩු කිරීම හෝ සම්පූර්ණයෙන් ඉවත් කිරීම සහතික කිරීම සඳහා ව්‍යවස්ථාපිත සහ නීතිමය අවශ්‍යතාවයන් ඉටු කර ඇත.

## 22.0 <u>විගණකයින්</u>

සමාගමේ වර්තමාන විගණකවරු ලෙස රජයේ විගණකාධිපති කටයුතු කරයි.

විගණකවරුන්ගේ ගාස්තු සම්බන්ධව තීරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය පැවරිය යුතු බවට වන යෝජනාවක් ද වාර්ෂික මහා සභා රැස්වීමේ දී සළකා බැලීමට කටයුතු කොට ඇත.

සමාලෝචනයට භාජනය වූ 2024/25 වර්ෂය සඳහා සමාගම විසින් වෙන්කරන ලද මුළු විගණන ගාස්තුව රුපියල් 360,000 ක් විය. බදු උපදේශන සේවා සැපයීම වෙනුවෙන් අමරසේකර සහ සමාගමට වර්ෂය සඳහා රුපියල් 279,567.44 ක මුදලක් ගෙවන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස පරිදි මෙම සමාගම හෝ එහි අනු සමාගම් සමඟ විගණකයින්ගේ ස්වාධීනත්වයට බලපෑමක් වන ආකාරයේ කිසිදු සම්බන්ධතාවයක් නොවීය.

**අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් :**



සභාපති



අධ්‍යක්ෂ

## <u>මෙහෙයුම් ක්‍රියාවලි සමාලෝචනය 2024/2025</u>

1.0 **<u>පිරිවැටුම / ආදායම</u>**

2023/2024 වර්ෂයේ රුපියල් මිලියන 1,080 හා සසඳන විට 2024/2025 වර්ෂයේ සමාගම මිලියන 1,215 පිරිවැටුමක් වාර්තා කර ඇත. මෙය ප්‍රමාණයෙන් සහ වටිනාකමින් 12% කටත් වඩා වර්ධනයකි. වසරේ මුල් මාස 05 තුළ අධි ශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් සඳහා තිබූ ඉල්ලුම ($P_2O_5$ 28 % වැඩි ) වර්ෂය තුළ ඉහළ පිරිවැටුමක් වාර්තා කිරීමට හේතු විය.

.

**<u>ප්‍රමාණය (මෙට්‍රික් ටොන් )</u>**




**<u>වටිනාකම (රුපියල් මිලියන )</u>**



## 2.0 ලාභය

### මෙහෙයුම් ලාභය

2024/2025 මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් ලාභය රු මිලියන 364.6 කි. එය ගිය වසරේ මිලියන 239.6 ට සාපේක්ෂව 50% කට වඩා වැඩි වීමකි. අධි ශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් ( මෙ.ටො. 10,200 ) මගින් ඉහළ ලාභයක් ලැබීම මෙයට හේතු වී ඇත.




### බදු පෙර ලාභය ( PBT )

2024/25 වසරේ බදු පෙර ලාභය රු.මිලියන 465.5 ක් වන අතර එය පසුගිය වසරට සාපේක්ෂව 25% වර්ධනයක් වේ. මෙයට ප්‍රධාන වශයෙන් පොලී ආදායම ඇතුළු අනෙකුත් ආදායම් රු. මිලියන 100.9 ක් ද ඇතුළත් වේ.



## 3.0 ශුද්ධ වත්කම - ( කොටස්කරුවන්ගේ අරමුදල් )

ශුද්ධ වත්කමෙහි අගය බිලියන 1.27 දක්වා ඉහළ ගොස් ඇති අතර එය පසුගිය වසරට සාපේක්ෂව 20% ක වර්ධනයකි.




## 4.0 මුළු වත්කම

වර්ෂය තුළ මුළු වත්කමෙහි වටිනාකම රුපියල් බිලියන 1.469 සිට බිලියන 1.511 දක්වා ඉහළ ගොස් ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ වසර තුළ ස්ථාවර තැන්පතු 34% කින් ඉහළ යාමයි.



**<u>ව්‍යාපෘති සහ යටිතල පහසුකම් සංවර්ධනය</u>**

I. දේශීය පරිභෝජනය සඳහා සිංගල් සුපර් පොස්පේට් (SSP) නිෂ්පාදනය කිරීම සඳහා රොක් පොස්පේට් ($P_2O_5$ 33% ) මෙ.ටො. 36,000 ක් වාර්ෂිකව ලංකෙම් මිනරල් සමාගමට ලබා දීමට " අමුද්‍රව්‍ය සැපයීමේ ගිවිසුමකට" එළඹ ඇත.

II. රේඛිය අමාත්‍යාංශය විසින් කැඳවන ලද අභිලාශ ප්‍රකාශ කිරීම් ( Expression Of Interest – EOI ) අනුකූලව දේශීයව සිංගල් සුපර් පොස්පේට් (SSP) නිෂ්පාදනයට අවශ්‍ය පහසුකම් සැළසීමට එප්පාවල ව්‍යාපෘතියේ සමස්ත පහසුකම් හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා සැළැස්මක් සකස් කිරීම

III. නව නිමි භාණ්ඩ ගබඩාවක් ඉදි කිරීම ආරම්භ කර ඇති අතර ඒ සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී . එය 2025 /2026 වසරේ දී අවසන් කිරීමට අපේක්ෂිතය.

IV. කුලී පදනම මත ලබා ගෙන ඇති වීල් ලෝඩර් ( කැණීම් සඳහා භාවිතා කරනු ලබන ) ෆොක්ලිෆ්ට් යන්ත්‍ර වෙනුවට ලංකා පොස්පේට් සමාගම විසින් මිලදී ගත් වාහන හා යන්ත්‍ර ආදේශ කිරීමට කටයුතු කිරීම.

V. නිෂ්පාදනය සඳහා යොදා නොගත් ක්‍රෂර් යන්ත්‍රය නැවත එක්ලස් කර 2025/2026 වසරේ දී නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කිරීම

**සාමාන්‍යාධිකාරී**

## ලාභදායීත්වය 2024/2025

| | අයවැය | සත්‍ය | විචලනය | ළඟා කර ගත් % |
|---|---|---|---|---|
| විකුණුම් ( මෙ.ටො.) | 62.221 | 54.066 | (8,155) | 86.9% |
| නිෂ්පාදනය ( මෙ.ටො.) | 58,740 | 51,019 | (7,721) | 86.8% |
| | | | | |
| ආදායම ( රු මි.) | 1,386.48 | 1,215.66 | (170.82) | 87.7% |
| දළ ලාභය ( රු මි.) | 751.14 | 654.97 | (96.17) | 87.2% |
| මෙහෙයුම් ලාභය ( රු මි.)2025.03.31 දිනට | 419.30 | 364.56 | (62.85) | 85.1.% |
| අනෙකුත් ආදායම් ( රු මි.) | 94.61 | 100.90 | 6.29 | 106.6% |
| බදු පෙර ලාභය ( රු මි.)2025.03.31 දිනට | 513.91 | 465.46 | (48.45) | 90.6% |
| (-) ආදායම බදු | (98.18) | (134.58) | 36.40 | |
| ශුද්ධ ලාභය ( රු මි.) | 415.73 | 330.88 | (84.85 | 79.6% |

**මූල්‍ය තත්ත්වය 2025.03.31 දිනට**

| | | |
|---|---|---|
| වත්කම් | | |
| ජංගම නොවන වත්කම් | 232.28 | |
| ජංගම වත්කම් - තොග | 180.54 | |
| - වෙනත් වත්කම් | 175.59 | |
| - ස්ථාවර තැන්පතු | 810.71 | |
| - මුදල් හා සමාන දෑ | 112.77 | |
| එකතුව | | **1,511.89** |
| | | |
| වගකීම් | | |
| වගකීම් - ජංගම වගකීම් | 136.33 | |
| ජංගම නොවන වගකීම් | 108.77 | |
| එකතුව | | **245.10** |
| | | |
| කොටස් හිමියන්ගේ අරමුදල් (ශුද්ධ වත්කම් ) | | **1,266.79** |

# <u>පසුගිය වසර 10 සඳහා මූල්‍ය තොරතුරු</u>

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| <u>වර්ෂය සඳහා</u> | | | | | | | | | | |
| | **2015/16** | **2016/17** | **2017/18** | **2018/19** | **2019/20** | **2020/21** | **2021/22** | **2022/23** | **2023/24** | **2024/25** |
| අලෙවිය ( මෙ.ටො ) | 56,438 | 34,856 | 47,160 | 48,886 | 44,429 | 64,393 | 60,917 | 30,262 | 48,422 | 54,200 |
| නිෂ්පාදනය ( මෙ.ටො. ) | 55,222 | 34,502 | 46,857 | 46,609 | 46,364 | 61,519 | 62,281 | 33,675 | 49,547 | 51,019 |
| | | | | | | | | | | |
| | රුපියල් දහස් | | | | | | | | | |
| ආදායම | 562,735 | 366,094 | 493,551 | 530,975 | 510,004 | 750,374 | 741,553 | 546,100 | 1,080,039 | 1,215,662 |
| බදු පෙර ලාභය / ( අලාභය ) | 60,894 | (32,008) | 16,594 | 29,694 | 13,480 | 150,582 | 157,030 | 69,334 | 363,349 | 465,461 |
| මූල්‍ය වසර සඳහා ශුද්ධ ලාභය ( අලාභය ) | 26,587 | (10,534) | 3,220 | 33,385 | 5,489 | 124,017 | 122,783 | 44,037 | 239,415 | 330,881 |
| | | | | | | | | | | |
| <u>මූල්‍ය වසර අවසානයට</u> | | | | | | | | | | |
| | **2015/16** | **2016/17** | **2017/18** | **2018/19** | **2019/20** | **2020/21** | **2021/22** | **2022/23** | **2023/24** | **2024/25** |
| කොටස්කරුවන්ගේ අරමුදල් | 760,315 | 740,738 | 669,834 | 771,646 | 831,378 | 950,888 | 1,068,519 | 1,011,742 | 1,055,404 | 1,266,895 |
| කාරක ප්‍රාග්ධනය | 451,108 | 442,665 | 419,904 | 477,360 | 528,312 | 685,183 | 798,299 | 806,854 | 894,396 | 1,143,387 |
| මුළු වත්කම් | 860,451 | 836,113 | 757,572 | 892,603 | 948,649 | 1,099,694 | 1,184,905 | 1,310,280 | 1,468,740 | 1,511,892 |
| ස්ථාවර වත්කම් | 233,831 | 216,556 | 236,739 | 270,120 | 336,448 | 461,125 | 580,880 | 560,584 | 602,002 | 810,708 |
| කාර්ය මණ්ඩල පිරිවැය | 236,020 | 224,678 | 230,782 | 292,861 | 303,310 | 325,078 | 351,356 | 320,410 | 409,335 | 439,895 |
| සේවක සංඛ්‍යාව (ගණන) | 348 | 335 | 330 | 328 | 333 | 325 | 336 | 315 | 299 | 291 |
| | | | | | | | | | | |
| මහා භාණ්ඩාගාරයට සහ අනෙකුත් රාජ්‍ය ආයතන සඳහා ගෙවීම් | 74,572 | 40,770 | 47,381 | 48,502 | 54,533 | 83,806 | 106,493 | 106,719 | 397,299 | 529,990 |
| | | | | | | | | | | |
| <u>එක් කොටසකට</u> | රුපියල් | | | | | | | | | |
| | **2015/16** | **2016/17** | **2017/18** | **2018/19** | **2019/20** | **2020/21** | **2021/22** | **2022/23** | **2023/24** | **2024/25** |
| උපයා ගැනීම ( රු) | 3.67 | (1.45) | 0.44 | 4.60 | 0.76 | 17.1 | 16.93 | 6.07 | 33.02 | 45.65 |

# ආයතනික පාලන වාර්තාව

## 1.0 හැඳින්වීම

ලංකා පොස්පේට් සමාගම කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින සම්පූර්ණයෙන් ම රජය සතු සමාගමකි. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතන එක්ව නිකුත් කරන ලද මාර්ගෝපදේශ , ආයතනික පාලන ක්‍රමවේදයන්ට අනුකූලව ඉහළම ප්‍රමිතින් පවත්වාගෙන යාමට සමාගම කැපවී සිටී.

පොස්පේට් පොහොර තිරසාර නිෂ්පාදනය හා අලෙවිය තුළින් ජාතික ආර්ථිකයට දායක වීමේ වගකීම සාක්ෂාත් කර ගැනීමට සමාගම සතු සම්පත් භාවිතයේ විනිවිදභාවය , වගවීම , අඛණ්ඩ සහ ඵලදායී කළමණාකරණය සහතික කිරීම සමඟ හොඳ ආයතනික පාලන ක්‍රමවේද අත්‍යාවශ්‍ය බව අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනී.

## 2.0 පාලන රාමුව

ලංකා පොස්පේට් ලිමිටඩ් හි පාලන ව්‍යුහය පහත සඳහන් පනත් , චක්‍රලේඛන මත ස්ථාපිත කර ඇත.

- 2007 අංක 07 දරණ සමාගම් පනත
- සමාගමේ සංගමික ව්‍යවස්ථාවලිය
- රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ
- ආයතන සංග්‍රහය හා රාජ්‍ය මුදල් රෙගුලාසි
- අනෙකුත් අදාල රජයේ චක්‍රලේඛන හා නියෝග

## 3.0 අධ්‍යක්ෂ මණ්ඩලය

### 3.1 සංයුතිය

කොටස් හිමිකාරිත්වය දරණ මහා භාණ්ඩාගාර ලේකම්වරයා විසින් රේඛීය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කරන අතර ඉංජිනේරු, මූල්‍ය , කෘෂිකර්මාන්ත , කළමණාකරණය සහ නීතිය ඇතුළු විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි වෘත්තිකයින්ගෙන් සමන්විත වේ. ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කළමණාකාරිත්වයට උපාය මාර්ගික මඟ පෙන්වීම සහ අධීක්ෂණය සිදු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කරනු ලබයි.

2025 මාර්තු 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

- සභාපති
- විධායක නොවන අධ්‍යක්ෂවරුන් ( රේඛීය අමාත්‍යාංශයේ සහ මහා භාණ්ඩාගාරයේ නියෝජනය ඇතුළුව)
- අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් / සමාගම් ලේකම්

### 3.2 අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීම්

- ආයතනයේ දැක්ම , මෙහෙවර සහ උපාය මාර්ගික මඟ පෙන්වීම් පිළිබඳව සැළකිලිමත් වීම .
- ආයතනික සැළසුම් , ක්‍රියාකාරී සැළැස්ම , ප්‍රසම්පාදන සැළැස්ම, හා වාර්ෂික අයවැය අනුමත කිරීම,
- අදාල නීති, රෙගුලාසි සහ රජයේ නියෝග වලට අනුකූල වීම සහතික වීම
- මූල්‍ය කාර්ය සාධනය හා අවධානම් කළමණාකරණය අධීක්ෂණය කිරීම
- මූල්‍ය වාර්තාකරණය සහ අභ්‍යන්තර පාලනයන්හි අඛණ්ඩතාවය සහතික කිරීම
- එකම කොටස් හිමියා ලෙස රජයේ අවශ්‍යතාවයන් ආරක්ෂා කිරීම

### 3.3 රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩලය වසර පුරා ( 2024 ඔක්තෝම්බර් සිට 2025 ජනවාරි දක්වා හැර) මෙහෙයුම්, මූල්‍ය සහ උපාය මාර්ගික කරුණු සමාලෝචනය සඳහා රැස්විය . රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන්ට අනුකූලව එක් එක් අධ්‍යක්ෂවරයාගේ පැමිණීම වාර්තා කර නිරීක්ෂණය කරන ලදි.

## 4.0 අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු

රාජ්‍ය පරිපාලන මාර්ගෝපදේශ වලට අනුකූලව ඵලදායී පාලනයක් සහ වගවීම සහතික කිරීමට පහත උපකමිටු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවා ඇත.

### 4.1 විගණන හා කළමණාකරණ කමිටුව

මූල්‍ය ප්‍රකාශන වල අඛණ්ඩතාව , අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත්බව , අවදානම් කළමණාකරණය , සහ ව්‍යවස්ථාපිත බැඳීම් වලට අනුකූල වීම සහතික කිරීම සඳහා විගණන හා කළමණාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වන අතර විගණකාධිපති හා අභ්‍යන්තර විගණකවරුන් නිකුත් කරන වාර්තා සමාලෝචනය කරන අතර ඔවුන්ගේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරනු ලබයි.

### 4.2 ප්‍රසම්පාදන කමිටුව

සියළුම ප්‍රසම්පාදනයන් විනිවිදභාවයෙන් සහ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අදාලව හා භාණ්ඩාගාර චක්‍ර ලේඛනයන්ට අනුව සිදු කරන බව ප්‍රසම්පාදන කමිටුව විසින් සහතික කරයි.

## 5.0 කළමනාකරණය හා අභ්‍යන්තර පරිපාලනය

සාමාන්‍යාධිකාරිගේ ප්‍රධානත්වයෙන් යුත් කළමනාකරණ කණ්ඩායම විසින් , අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද උපායමාර්ග සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතුය. වත්කම් ආරක්ෂා කිරීම , වාර්තාවල නිරවද්‍යතාවය සහතික කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම සඳහා මනා අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කර ඇත.

විගණන කළමණාකරණ කමිටුවේ මඟ පෙන්වීම යටතේ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක වන අතර රේඛීය කළමණාකරණයෙන් ස්වාධීනව ක්‍රියාත්මක වේ. කමිටුව විසින් අනුමත කරන ලද වාර්ෂික විගණන සැළැස්මට අනුව වරින් වර අභ්‍යන්තර විගණනයන් පවත්වනු ලබයි.

## 6.0 අනුකූලතාව හා ආචාර ධර්ම

සදාචාරාත්මක , ව්‍යාපාරික පිළිවෙත් ආරක්ෂා කිරීමට සහ අදාල සියළු නීති සහ රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට ලංකා පොස්පේට් සමාගමට බැඳී ඇත. සමාගම සියළු මෙහෙයුම් සහ කොටස්කරුවන්ගේ සබඳතාවයන් මත අඛණ්ඩතාව , වගවීම හා සාධාරණත්වය ප්‍රවර්ධනය කරනු ලබයි.

ආයතනයේ සියළුම සේවකයින් ආයතනයේ විනය නීති සංග්‍රහයට අනුගත වන අතර වෘත්තීයභාවය සහ අඛණ්ඩතාවය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 7.0 සබඳතාවයන් හා කොටස්කරුවන්

ලංකා පොස්පේට් සමාගම එහි රේඛීය අමාත්‍යාංශය , මහා භාණ්ඩාගාරය , රජයේ විගණකවරුන් , ගැණුම්කරුවන් , සේවකයින් සහ මහජනතාව ඇතුළු ප්‍රධාන කොටස්කරුවන් සමඟ විවෘත හා ඵලදායී සබඳතා පවත්වා ගනිමින් සියළු ක්‍රියාකාරකම් ජාතික සංවර්ධන අරමුණු සමඟ පෙළ ගැසී ඇති බව සහතික කරයි.

## 8.0 වගවීම හා විනිවිදභාවය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති අතර විගණකාධිපති විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබේ.

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ සහ රාජ්‍ය මූල්‍ය චක්‍ර ලේඛ යටතේ අවශ්‍ය පරිදි මාසික කාර්තුමය සහ වාර්ෂිකව කාර්ය සාධන වාර්තා අදාල අධීක්ෂණ බලධාරීන් වෙත කාලෝචිතව ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරයි.

## 9.0 තිරසාරභාවය සහ සමාජ වගකීම්

ස්වභාවික සම්පත් වගකීමෙන් යුතුව භාවිතා කිරීම , පාරිසරික බලපෑම් අවම කිරීම , රැකියා සහ සමාජ සංවර්ධන මූල පිරීම් හරහා ග්‍රාමීය ප්‍රජාවට සහාය වීම කෙරෙහි අවධානය යොමු කරමින් සමාගම තිරසාර භාවිතයෙන් සිය මෙහෙයුම් කටයුතු වලට යොදා ගැනීම දිගින් දිගටම සිදු කර ගෙන යයි.

## 10.0 අනුකූලතා ප්‍රකාශය

2024/2025 මූල්‍ය වර්ෂය තුළ ලංකා පොස්පේට් සමාගම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතන නිකුත් කරන ලද මාර්ගෝපදේශ සහ අනෙකුත් අදාල නියාමන අවශ්‍යතාවල අදාළ විධිවිධානවලට අනුකූල වී ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

## විගණන හා කළමණාකරණ කමිටු වාර්තාව

විගණන සහ කළමනාකරණ කමිටුව යනු අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු උප කමිටුවකි. කමිටුවේ සභාපතිවරයා මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා වන අතර තවත් විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු කමිටුවේ අනෙකුත් සාමාජිකයින් වේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු සහ රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා නිරීක්ෂකයින් ලෙස කමිටුව නියෝජනය කරයි.

### රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනස්කම් කිහිපයක් තිබියදීත්, **2024/25** වර්ෂය තුළ විගණන සහ කළමනාකරණ කමිටුව තුන් වතාවක් රැස්වීමට හැකි විය. සමාගමේ වත්කම්වල ආරක්ෂාව සහතික කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරුන් මෙන්ම බාහිර විගණකවරුන් විසින් ඉදිරිපත් කරන ලද විගණන වාර්තා සහ පවතින පාලනයන්හි කාර්යක්ෂමතාව කමිටුව විසින් සමාලෝචනය කර ඇගයීමට ලක් කරන ලදී.

### නිගමනය

වාර්තා හොඳින් පරීක්ෂා කිරීමෙන් පසු, සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති, මෙහෙයුම් පාලනයන් සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට අදාළව ඉස්මතු කර ඇති ගැටළු නිවැරදි කිරීම සඳහා කමිටුව කළමනාකාරිත්වයට උපදෙස් ලබා දී ඇත. තවද, තීරණාත්මක කරුණු කිහිපයක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන්ගේ සලකා බැලීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා යොමු කරන ලදී.

සභාපති
විගණන සහ කළමනාකරණ කමිටුව
සී / ස ලංකා පොස්පේට් සමාගම

# විගණකවරුන්ගේ වාර්තාව


ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. : අයිඩබලිව්එම්/සී/එල්පීඑල්/1/2024/01
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2024 ඔක්තෝබර් 27 දින

සභාපති,
ලංකා පොස්පේට් ලිමිටඩ්.

**ලංකා පොස්පේට් ලිමිටඩ්හි 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ලංකා පොස්පේට් ලිමිටඩ්හි ("සමාගම") 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.3 සමාගමේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සමාගමේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගමේ ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ

විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**02. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට, සමූහය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 2015 මැයි 25 දිනැති අංක PED 1/2015 හා 2022 ජනවාරි 14 දිනැති අංක PED 1/2015(ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | (i) සභාපතිවරයාගේ අතිරේක ඉන්ධන වියදම් සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත් 2023 අප්‍රේල් 18 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව ස්ථානීය දුර සලකා ලංකා පෙස්පේට් සමාගමේ සභාපතිවරයාගේ අතිරේක ඉන්ධන වියදම අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීමෙන් ප්‍රතිපූර්ණය කිරීමේ හැකියාව පවතින බව දන්වා තිබුණි. එසේ වුවද එම අනුමැතිය ලබාගැනීමකින් තොරව සමාගමේ සභාපතිවරයා විසින් 2024 ජූලි සිට සැප්තැම්බර් දක්වා සහ 2025 පෙබරවාරි සිට මාර්තු දක්වා අනුමත මාසික ඉන්ධන ලීටර් 145 සීමාව ඉක්මවා රු.298,759 ක් වූ ඉන්ධන ලීටර් 971.6 ක් ලබා ගෙන තිබුණි.<br><br>(ii) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව සමාගමේ සාමාන්‍යාධිකාරීවරයා විසින් 2024 මැයි, දෙසැම්බර් සහ 2025 ජනවාරි හා මාර්තු දක්වා අනුමත මාසික ඉන්ධන ලීටර් 145 ඉක්මවා රු.261,085 ක් වූ ඉන්ධන ලීටර් 875.5 ක් ලබාගෙන තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ළ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ළු) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර නොමැති බව

3. වෙනත් කරුණු

(අ) ඒකකයක් රු. 200 බැගින් මිලදී ගත් ඛනිජ ඇඹරුම් යන්ත්‍ර සඳහා යොදනු ලබන රබර් බුෂ් ඒකක 81 ක් ගබඩාවේ පැවතියදී, තොගය ශුන්‍ය බව දක්වමින් 2022 දෙසැම්බර් 17 දින රබර් බුෂ් ඒකක 200 ක් ඒකකයක් රු.79,082 ක් බැගින් රු.15,816,482 කට ආනයනය කර තිබුණි. ඒ අනුව රු.40,000 ක් වැනි අවම පිරිවැයක් යටතේ මිලදී ගැනීමට හැකිව තිබූ අදාළ අයිතම් තොගය ඉතා ඉහළ වටිනාකමකට ආනයනය කිරීම තුළින් රු.15,776,482 ක අලාභයක් සමාගමට සිදුකර තිබුණි. මෙම තොගය විගණිත දින වූ 2025 සැප්තැම්බර් 15 වන විටත් භාවිතයට නොගෙන නිෂ්කාර්යව තබා තිබූ අතර මිලදී ගැනීමේ දී එම රබර් බුෂ්වලට අමතරව සම්බන්ධක ඇණ(Coupling bolt) ඒකක 198 ක්ද ඒ සමඟ ලැබී තිබුණද එම ඇණ වලින් අදාළ යන්ත්‍රයට කිසිදු ප්‍රයෝජනයක් නොමැති බැවින් ඒවාද නිෂ්කාර්යව තබා තිබුණි.

(ආ) යන්ත්‍රාගාරය සඳහා අවශ්‍ය අමතර කොටස්වල අවශ්‍යතාවය ඇගයීමක් සිදු කිරීමකින් තොරව 2012 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා විවිධ අවස්ථාවලදී මිලදී ගන්නා ලද රු.6,679,768 ක් වටිනා අමතර කොටස් ගබඩාව තුළ භාවිතයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව තිබුණි.

(ඇ) වසර ගණනාවක සිට බැහැර කරන ලද අබලි යකඩ සහ භාවිතයෙන් ඉවත් කරන ලද යන්ත්‍ර කොටස් අපහරණය කිරීමට කටයුතු නොකර එප්පාවල යන්ත්‍රාගාර පරිශ්‍රයේ අනාරක්ෂිතව දමා තිබුණි.

(ඈ) 2014 වර්ෂයේදී රු.21,226,633 ක ප්‍රාග්ධන වියදමක් දරමින් ආරම්භ කරන ලද වාරියපොල පොල් පොහොර ව්‍යාපෘතියේ නිෂ්පාදන කටයුතු 2021 මැයි 05 වන විට නවතා දමා තිබූ අතර එම කාලය තුළදී දිගින් දිගටම එකතුව රු.මිලියන 31.71 ක අලාභයක් ලබා තිබුණි. තවද, ව්‍යාපෘති කාර්යයන් සඳහා පස් අවුරුදු බදු පදනම මත ලබා ගන්නා ලද ඉඩමෙහි බදු කාලසීමාව අලුත් කිරීමකින් තොරව නිෂ්පාදන කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි. එබැවින් 2022 සැප්තැම්බර් මස සිට සමාගමට ව්‍යාපෘති භූමිය තුළට ඇතුළු වීම ඉඩම් හිමිකාර පාර්ශවය විසින් වළක්වා තිබූ අතර එම ආරවුල නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2024 වර්ෂය අවසානයේ සිදුකළ වාර්ෂික තොග සත්‍යාපනයේදී ගබඩා ලේඛන අනුව ඩීසල් තොගය ලීටර 1000.5 ක් වුවද, භෞතික ඩීසල් ලීටර් ප්‍රමාණය 714 ක් වූයෙන් ලීටර 286.50 ක ඌනතාවයක් විය.

(ඊ) පරිසර අමාත්‍යවරයාගේ අංක 16/2012 හා 2012 අප්‍රේල් 20 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 4 ඡේදයේ සඳහන් ආකාරයට පොහොර කර්මාන්තය සඳහා භාවිත කෙරෙන ඇපටයිට් ඛනිජය අපනයනය කිරීමට ඉඩ දී නොතිබුණු තත්ත්වයකදී, ලංකා පොස්පේට් සමාගම විසින් තෝරා ගත් පෞද්ගලික අංශයේ සමාගම් 3 ක් වෙත අපනයනය අරමුණු කරගෙන 2023 හා 2024 වර්ෂ තුළදී රොක් පොස්පේට් මෙ.ටොන් 29975 ක් රු.772,017,500 කට අලෙවි කර තිබුණි. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් ලබාගත් අපනයන දත්ත අනුව මෙම රොක් පොස්පේට් තොගය අදාළ සමාගම් තුන (03) විසින් රු.1,300,329,759 ක ඉහළ මිලකට අපනයනය කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.54,360,240 ක් වූ ණය ගැති ශේෂය තුළ බොල්ණය ලෙස ප්‍රතිපාදනය කර තිබූ, වසර පහකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පවතින ණය ශේෂ වල එකතුව රු.6,483,485 ක් වූ අතර වූ 2025 සැප්තැම්බර් 15 වන දින වන විටත් මෙම ශේෂ අයකර ගෙන නොතිබුණි.

| | සේවක අර්ථ සාධක අරමුල සඳහා ගෙවීම් 22% | | 50,397,606 | 50,397,606 |
| | සේවක භාරකාර අරමුදල සඳහා ගෙවීම් 3% | | 6,872,401 | 6,872,401 |
| | පාරිතෝශිත ගෙවීම් | | 5,684,105 | 6,319,320 |
| | | | | |
| **23** | **ආදායම් බදු වියදම** | | | |
| | වසරේ ලාභය මත ආදායම් බද්ද | | 142,460,424 | 120,370,720 |
| | විලම්භිත බදු වලින් මාරු කිරීම | | (7,880,720) | 3,563,893 |
| | | | **134,579,704** | **123,934,613** |
| | | | | |
| **23.1** | **ආදායම් බදු වියදම් සැසඳීම** | | | |
| | බදු පෙර ලාභය | | 465,460,931 | 363,349,438 |
| | වෙළඳ නොවන ආදායම | | (93,792,132) | (122,598,580) |
| | බදු ගණනයේදී වියදමක් ලෙස අඩු කර ගත නොහැකි දැ | | 37,238,698 | 72,280,319 |
| | පසුගිය වසරට අදාලව මේ වර්ශයේ හඳුනාගත් බද්දට යටත් වන සංශෝධන | | - | - |
| | අඩු කර ගැනීමට අවසර දී ඇති වියදම් | | (20,645,271) | (30,260,882) |
| | | | | |
| | **තක්සේරු කළ හැකි ව්‍යාපාර ආදායම** | | **388,262,225** | **282,770,296** |
| | | | | |
| | **බද්දෙන් නිදහස් වෙනත් මූලාශ්‍ර මගින් ආදායම** | | **86,605,854** | **118,145,034** |
| | බදු නිදහස් ආදායම | | - | - |
| | **තක්සේරු කළ හැකි පොලී ආදායම** | | **86,605,854** | **118,145,034** |
| | **තක්සේරු කළ හැකි මුළු ආදායම** | | **474,868,079** | **400,915,330** |
| | බද්දට යටත් ගෙවීම් | | - | - |
| | **බදු කළහැකි ආදායම** | | **474,868,079** | **400,915,330** |
| | | | | |
| | බදු අය කළ හැකි ව්‍යාපාර ආදායම මත බද්ද | 30% | 116,478,668 | 84,831,089 |
| | බදු අය කළ හැකි ආයෝජන මත බද්ද | 30% | 25,981,756 | 35,443,510 |
| | | | | |
| | පෙර වසරට සාපේක්ෂව ප්‍රතිපාදන | | | 96,121 |
| | | | - | |
| | **වත්මන් ආදායම් බදු වියදම** | | **142,460,424** | **120,370,720** |

**ලංකා පොස්පේට් ලිමිටඩ්**

2025.03.31 දිනට අවසන් මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සටහන

*(සියළුම සංඛ්‍යා ශ්‍රී ලංකා මුදලින් ප්‍රකාශිතය)*

| | | | |
|---|---|---|---|
| **24** | **ප්‍රත්‍යාගණන සංචිත සඳහා විලම්භිත බදු ගැලපීම** | | |
| | | ***2025 මාර්තු 31*** | ***2023/24*** |
| | නැවත තක්සේරු අතිරික්තය (මෝටර් රථ නොමැතිව) | 55,931,086 | 55,931,086 |
| | ( -)වසර අවසානයේ ප්‍රත්‍යාගණන මුදල මත ක්ෂය වීම් | (25,655,891) | (21,379,909) |
| | ප්‍රත්‍යාගණනය මත ලාභය | **30,275,195** | **34,551,177** |
| | ඉදිරියට ගෙන ආ විලම්භිත බදු | 10,365,353 | 11,648,148 |
| | පසුගිය වසර සඳහා විලම්භිත බදු | 9,404,475 | 10,365,353 |
| | **වසර සඳහා වෙනත් විස්තීර්ණ ආදායම සහ ප්‍රත්‍යාගණන අතිරික්තය ගැළපීම** | **960,878** | **1,282,795** |

| | | | |
|---|---|---|---|
| **25** | **කොටසක ඉපයීම** | | |
| | කොටසක සාමාන්‍ය ඉපයීම ගණනය කර ඇත්තේ සාමාන්‍ය කොටස් හිමියන්ට බෙදා හැරිය හැකි ලාභය වසර තුළ බර තැබූ සාමාන්‍ය කොටස් වල එකතුවෙන් බෙදීම මතය | | |
| | සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි ශුද්ධ ලාභය (රු.) | 330,881,227 | 239,414,825 |
| | බර කළ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව (අංක.) | 7,251,000 | 7,251,000 |
| | **කොටසක ඉපයීම (රු.)** | **45.63** | **33.02** |

## 6. මූල්‍ය අවදානම් කළමනාකරණය

වෙළඳපල අවදානම් ( මුදල් අවදානම පොළී අනුපාත අවදානම සහ මිල මට්ටම් අවදානම් ඇතුළත්ව ) ණය අවදානම , ද්‍රවශීල අවදානම් ආදී විවිධාකාර වූ මූල්‍ය අවදානම් වලට සමාගම භාජනය වේ. සමාගමක සමස්ථ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය අවිනිශ්චිත මූල්‍ය අවදානම මත පදනම් වී ඇති අතර සමාගමෙහි මූල්‍ය ක්‍රියාකාරීත්වය මත ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල අවම කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ ප්‍රතිපත්තීන්ට අනුකූලව මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කරනු ලබයි.

සමාගමේ මූලික මූල්‍ය උපකරණ කෙටිකාලීන තැන්පතු, මුදල් වෙළඳපොළ ආයෝජන සහ මුදල් වලින් සමන්විත වේ. මෙම මූල්‍ය උපකරණ වල ප්‍රධාන අරමුණ වන්නේ සමාගමේ මෙහෙයුම් කටයුතු සඳහා ද්‍රවශීලතාවය වැඩි කිරීම හා පවත්වාගෙන යාම සහ සමාගමේ මූල්‍ය සංචිත මත වූ ප්‍රතිලාභ උපරිම කිරීම වේ. වෙළඳ ලැබිය යුතු , වෙළඳ ගෙවිය යුතු ආදී වූ ව්‍යාපාර කටයුතු වලින් ඍජුව ඇති වූ මූල්‍ය උපකරණ ද සමාගම සතුව ඇත.

### ( අ) ණය අවදානම

මූල්‍ය වත්කම්වල තත්ත්වය ( ගුණය) හෝ හානිකරණයක් නොමැතිව තක්සේරු කළහැකි වනුයේ බාහිර ණය අනුපාත ( තිබේ නම් ) වලට හෝ ප්‍රතිවිරුද්ධ පැහැර හැරීමේ අනුපාත පිළිබඳ අතීත තොරතුරු වලට අනුකූලවය. ණය අවදානම හටගනු ලබනුයේ මුදල් හා මුදල් සමාන දෑ සහ බැංකු හා මූල්‍ය ආයතනවල ඇති තැන්පතු මෙන්ම ගනුදෙනුකරුවන්ගෙන් ලැබීමට ඇති ණය හිඟ ලැබිය යුතු දෑ සහ ඒ හා බැඳුනු ගනුදෙනු ඇතුළත්වය.

### ( ආ) වෙළඳ ලැබිය යුතු දෑ

වෙළඳ ලැබිය යුතු දෑ තුළ අන්තර්ගත වී ඇත්තේ දේශීය ගනුදෙනුකරුවන්ය. ලැබිය යුතු ශේෂවල මූල්‍ය තත්ත්වය පිළිබඳ අඛණ්ඩ ඇගයීමක් ආයතනය විසින් සිදු කරනු ලැබේ. එක් ප්‍රතිවිරුද්ධ පාර්ශවයක් හෝ ප්‍රතිවිරුද්ධ පාර්ශව කණ්ඩායම් පිළිබඳව සැළකිය යුතු ණය අවදානමක් සමාගම සතුව නැත. සමාගමක් ණය කොන්දේසි අනුමත කිරීමට ප්‍රථම පාරිභෝගිකයා ඇගයීමට ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පිහිටුවාගෙන ඇත.

### ( ඇ) ද්‍රවශීල අවධානම

මුදල් ප්‍රවාහ පුරෝකතනය කිරීම කරනු ලබන්නේ මූල්‍ය අංශය විසිනි. මෙහෙයුම් අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් මුදල් පවතීද යන්න තහවුරු කර ගැනීමට මූල්‍ය අංශය විසින් අඛණ්ඩව අදාල පුරෝකතනයන් අධීක්ෂණය කරයි. කාරක ප්‍රාග්ධන කළමනාකරණය සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා ඇති අතිරික්ත මුදල් රාජ්‍ය බැංකු තැන්පතුවල ආයෝජනය කර ඇත. වාර්තා කරන දිනයේ දී සමාගම සතුව ස්ථාවර තැන්පතු රුපියල් 810,707,685/- ( 2024.03.31 රු . 602,001,770/- ) පැවතීය. එය ද්‍රවශීලතා අවධානම් කළමනාකරණය කිරීමෙහි ලා අවශ්‍ය මුදල් පහසුවෙන් මුදල් ලබා ගැනීම තහවුරු කර ඇත.

### ( ඉ) පොළී අනුපාත අවදානම

සමාගම සතු මුදල් හා බැංකු ශේෂයන් වල රජයේ සුරක්ෂිත බැංකු වල පවතින තැන්පතු ඇතුළත් වේ. ප්‍රතිලාභ චක්‍රවල හැසිරීම සහ පොලී අනුපාත විචලනයන් ක්‍රියාකාරීව අධීක්ෂණය කිරීමෙන් සමාගමට පොලී අනුපාත අවදානම පාලනය කළ හැකිය.

## ( ඊ ) ප්‍රාග්ධන අවදානම් කළමනාකරණය

ප්‍රාග්ධන කළමනාකරණයෙහිලා සමාගමේ අරමුණ වනුයේ කොටස් හිමියන්ට සහ අනිකුත් පාර්ශවයන්ට ප්‍රතිලාභ ලබා දීම සඳහා ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වා ගැනීම තුළින් අඛණ්ඩ පැවැත්මේ හැකියාව ආරක්ෂා කර ගැනීම වේ.

## 27. ප්‍රාග්ධන බැඳීම් හා අවිනිශ්චිත වගකීම්

පහත සඳහන් දෑ හැර සමාගමට ප්‍රමාණාත්මක ප්‍රාග්ධන කැපවීම සහ අවිනිශ්චිත වගකීම් නොමැත.

| | රු. |
|---|---|
| රඳවා ගැනීමේ මුදල් - නව Jaw ක්‍රෂර් 02 ක මත<br>( කේෂර ඉංජිනියරින් ( පුද්ගලික ) සමාගම පිලියන්දල | 3,314,882.70 |

## 27.1 මූල්‍ය බැඳීම්

පහත සඳහන් කරුණු හැර වාර්තාකරණ දිනය අවසානයේ කිසිදු ප්‍රමාණාත්මක මූල්‍ය බැඳීමක් නොතිබුණි.

| | රු. |
|---|---|
| විදුලි බිල්පත් ගෙවීම - 2025 මාර්තු | 2,488,636.00 |
| 2025.03.31 දිනට ගෙවිය යුතු රඳවා ගැනිමේ බද්ද | 2,060,069.00 |
| WPP බෑග් සැපයීම මත රඳවා ගත් මුදල් - සෙන්ට්‍රල් පොලිසැක් ( පුද්ගලික ) සමාගම | 1,596,000.00 |
| ආදායම් බදු ස්වයං තක්සේරු ගෙවීම 2024/25 – 4 කාර්තුව | 35,618,610.00 |
| නොගෙවූ WPP බෑග් පිරිවැය - ලංකා පොලිසැක් ( පුද්ගලික ) සමාගම | 17,989,500.00 |
| ගෙවිය යුතු රාජ්‍ය භාගය - ජනවාරි - මාර්තු 2025 GSMB | 12,654,714.00 |
| නොගෙවූ WPP බෑග් පිරිවැය - සෙන්ට්‍රල් පොලිසැක් ( පුද්ගලික ) සමාගම | 10,979,569.60 |
| එකතු කළ අගය මත බදු ගෙවීම - මාර්තු 2025 දේ.ආ.දෙ. | 12,286,761.00 |
| ඛනිජ බදු - ජනවාරි - මාර්තු 2025 | 1,175,721.00 |
| සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව - ගල්කිරියාගම ( අත්තිකාරම් ලැබීම් ) | 2,540,850.00 |
| කැණීම් මෙහෙයුම් සඳහා වාහන කුලියට ගැනීම | 1,218,700.00 |
| සේවක අර්ථ සාධක / සේවක භාරකාර අරමුදල් ගෙවීම - 2025 මාර්තු | 5,269,818.00 |
| ( නොගෙවූ ) ඉඩම් බදු - වාරියපොළ ව්‍යාපෘතියේ ඉඩම සඳහා ගල්ලෑහේපිටියේ ප්‍රේමරතන හිමි ( ජූනි 21 - සැප්තැම්බර් 22 දක්වා) | 480,000.00 |

## 27.2 නීතිමය බැඳීම

1. නීතිඥ සුනිල් වටගල මහතා විසින් ඔහුගේ සේවාදායකයින් වන එස් අශෝක අබේසිරි සහ එස් ඩී රූපසිංහ යන අය සේවය තහනම් කිරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත 204/2023 (F/R) සහ 203/2023 (F/R) යන අයදුම්පත් ගොනු කර ඇත.

2. සෙන්ටර් ෆෝ එන්වයර්මන්ටල් ජස්ටිස් ග්‍රැන්ටි ලිමිටඩ් සහ තවත් දෙදෙනෙකු විසින් රොක් පොස්පේට් අපනයනය කිරීම සඳහා නිකුත් කරන ලෙස කරන ලද 301/ 2023 (F/R) යන ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අයදුම්පත්‍රයක් ගොනු කර ඇත.

## 28. විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

**2025 මාර්තු 31 දිනට පාරිතෝෂිත වගකීම්වල සත්‍ය තක්සේරුව**
ගිණුම්කරණ හෙළිදරව් කිරීම

**නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ (PV – DBO ) වර්තමාන අගය වෙනස් කිරීම**

| | | රු. |
|---|---|---|
| 2024 අප්‍රේල් 01 දිනට **(PV – DBO )** සඳහා ප්‍රතිපාදන | = | 60,365,048 |
| කාල සීමාව සඳහා පොලී පිරිවැය | = | 7,545,631 |
| කාල සීමාව සඳහා වත්මන් සේවා පිරිවැය | = | 5,031,372 |
| කාල සීමාව තුළ හැර ගිය අය සඳහා ගෙවූ / ගෙවිය යුතු පාරිතෝෂිතය | = | (5,684,105) |
| මාරු කළ සේවකයින් සඳහා පාරිතෝෂිත ගෙවීම් (පිටත) | = | - |
| මාරු කළ සේවකයින් සඳහා පාරිතෝෂිත ගෙවීම් (ඇතුළත) | | - |
| **PV – DBO** මත සත්‍ය ලාභ / ( අලාභය) | = | 20,457,482 |
| 2025 මාර්තු 31 දිනට **PV – DBO )** සඳහා ප්‍රතිපාදන | = | 87,715,427 |

**<u>ශේෂ පත්‍රයේ සහ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇති මුදල්</u>**

**<u>ශේෂ පත්‍රයේ හඳුනාගෙන ඇති වගකීම්</u>**

| | | |
|---|---|---|
| 2025 මාර්තු 31 දිනට පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | = | 87,715,427 |
| 2025 මාර්තු 31 දිනට හඳුනා නොගත් සත්‍ය ගණන ලාභ / ( අලාභ) | = | - |
| 2025 මාර්තු 31 දිනට ශේෂ පත්‍රයේ හඳුනාගෙන ඇති වගකීම් | = | 87,715,427 |

**<u>ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් වියදම්</u>**

| | | |
|---|---|---|
| පොලී පිරිවැය | = | 7,545,631 |
| වත්මන් සේවා පිරිවැය | = | 5,031,372 |
| ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් වියදම් | = | 12,577,033 |

**<u>වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇති වියදම්</u>**

| | | |
|---|---|---|
| වහාම හඳුනාගත් ශුද්ධ සත්‍ය ගණන ( ලාභ ) / අලාභ | = | 20,457,482 |
| වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇති වියදම් | = | 20,457,482 |

## 29 වාර්තාකරණ කාලච්ඡේදයෙන් පසු සිදුවීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයේ සිට මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් හෝ හෙළිදරව් කිරීම අවශ්‍ය වන කිසිදු තත්ත්වයක් උද්ගත වී නොමැත

## 30 සම්බන්ධීකරණ පාර්ශව ගනුදෙනු

### 30.1 ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සමඟ ගනුදෙනු

සමාගමේ කටයුතු සැළසුම් කිරීම මෙහෙයවීම හා පාලනය සඳහා බලය හා වගකීම ඇති පුද්ගලයින් සම්බන්ධිත පාර්ශවයන්ට අයත් වන අතර ඔවුන් සමාගමේ අධ්‍යක්ෂවරුන් වේ. වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල වල සාමාජිකයින්ට කළ ගෙවීම් පහත පරිදි වේ.

| | 2024/2025 | 2023/2024 |
|---|---|---|
| | රු | රු |
| කෙටි කාලීන | 3,170,075 | 4,632,199 |

### 30.2 අනෙකුත් සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු කිරීම

මූල්‍ය වර්ෂය තුළ LKAS 24 යටතේ අර්ථ දක්වා ඇති සම්බන්ධිත පාර්ශවයන් ලෙස කිසිදු පාර්ශවයක් සහ ගනුදෙනු හඳුනාගෙන නොමැත.

# ආයතනික තොරතුරු, සැළකිය යුතු ගිණුම්කරණය විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පන

## 1. සංස්ථාපිත තොරතුරු

### 1.1 පිහිටි ස්ථානය සහ නීතිමය ස්වරූපය

සීමාසහිත ලංකා පොස්පේට් සමාගම යනු, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියා පදිංචි සීමිත වගකීම් සහිත සමාගමකි. 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර පොදු සමාගම් බවට පත් කිරීමේ පනතට අනුව සීමාසහිත ලංකා පොස්පේට් සමාගම සීමාසහිත වගකීම් සහිත සමාගමක් වශයෙන් පරිවර්තනය කරන ලදී.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 14 , නව කැළණි පාලම පාරේ , අංක 73 1/1දරණ ස්ථානයෙහි ද , පාෂාණමය පොස්පේට් ( ඇපටයිට් ) නිධිය එප්පාවලද පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ බහු වාර්ෂික භෝග සඳහා පොහොර වශයෙන් යොදා ගන්නා පොස්පේට් කැණීම සිදු කිරීම, සකස් කිරීම හා පාෂාණ අලෙවි කිරීමයි. මීට අමතරව සමාගම විසින් පොහොර මිශ්‍ර කිරීමේ මෙහෙයුම් ක්‍රියාවලියක් 2014 වර්ෂයේ දී වාරියපොළ කනත්තේවැවේ දී ආරම්භ කරන ලදී.

### 1.3 වාර්තාකරණ කාලපරිච්ඡේදය

2024.04.01 දින සිට 2025.03.31 දින දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය වාර්තාවලින් ආවරණය කරනු ලබයි.

### 1.4 නිකුත් කිරීම සඳහා අනුමැතිය දුන් දිනය

2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025 ජුනි මස 20 අනුමැතිය දෙන ලදී.

## 2. පිළියෙළ කිරීමේ පදනම

### 2.1 අනුකූල වීමේ ප්‍රකාශනය

සමාගමේ මූල්‍ය ප්‍රකාශන ( මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය , විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය , මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය , සමඟ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් වල සාරාංශ ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන් ( LKAS සහ SLFRS ) වලට අනුව සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වන ලෙස පිළියෙළ කර ඇත.

### 2.2 මැනීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අඩංගු පහත සඳහන් ප්‍රමාණාත්මක අයිතමයන් හැර මූල්‍ය ප්‍රකාශන , ඓතිහාසික පිරිවැය පදනම් කර ගෙන පිළියෙළ කර ඇත.

- විකිණීම සඳහා තබා ඇති මූල්‍ය වත්කම් සාධාරණ අගය මත මනිනු ලබයි.
- ආර්ථික ප්‍රතිලාභ බැඳියාවේ වගකීම වර්තමාන වටිනාකමට හඳුනා ගනී.
- සමාගමට ආදායම් උත්පාදනය සඳහා භාවිතා කරන ලද පොස්පේට් තැන්පතුවේ වටිනාකම විශ්වාසවන්ත ලෙස මිනුම් කිරීමට නොහැකි වූ බැවින් වත්කමක් වශයෙන් මූල්‍ය වාර්තාවල හඳුනාගෙන නොමැත.

## 2.3 ඉදිරිපත් කිරීමේ සහ ක්‍රියාකාරී ව්‍යවහාරික මුදල්

ඉදිරිපත් කිරීමේ හා ක්‍රියාකාරී ව්‍යවහාර මුදල් ලෙස සමාගම ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. සියළුම මූල්‍ය ප්‍රකාශන ආසන්නම රුපියලට වැටයූ ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

## 2.4 සංසන්දනාත්මක තොරතුරු

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම - LKAS - 01 ට අනුව පෙර වර්ෂවල අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්තීන් අඛණ්ඩව සමාගම විසින් අනුගමනය කොට ඇත.

## 2.5 ප්‍රමාණාත්මක බව හා ඒකරාශී කිරීම

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම - (LKAS 01) ප්‍රමිතියට අනුව සෑම ප්‍රමාණාත්මක සමාන අයිතම පන්තියක්ම මූල්‍ය ප්‍රකාශන තුළ වෙන වෙනම ඉදිරිපත් කර ඇත. ස්වභාවය හා ක්‍රියාකාරකම් සමාන නොවන අයිතම ද ප්‍රමාණාත්මක නම් , වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කිරීම පහත අවස්ථාවලදී පමණක් සිදු කළ හැකියි. එහි හඳුනාගත් වටිනාකම හිලව් කිරීමට නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි අයිතියක් තිබීම. එහි ශුද්ධ පදනමක් මත පියවීමේ අභිප්‍රායක් තිබීම. සමකාලීන ලෙස වත්කම් හා වගකීම් උපලබ්ධි කිරීම , ගිණුම්කරණ ප්‍රමිත හෝ අර්ථකථන මගින් අවශ්‍ය වන විට හෝ අවසර ලබා දෙන විට හෝ ගිණුම් ප්‍රතිපත්තීන් වල නිශ්චිතව අනාවරණය කළ විට හෝ හැර ආදායම් හා වියදම් , ආදායම් ප්‍රකාශය තුළ හිලව් කිරීම කළ නොහැක.

# 3. විශේෂිත වූ ගිණුම්කරණ විනිශ්චයන් , ඇස්තමේන්තුගත කිරීම් සහ උපකල්පනයන්

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා අනාගතයට අදාල යම් යම් තීරණාත්මක ගිණුම්කරණ උපකල්පන වල භාවිතය අවශය වේ . තවදුරටත් , සමාගමේ කළමනාකරණය විසින් වාර්තා කරන කාලය අවසානයේ දී ආදායම් , වියදම් , වත්කම් සහ වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් වල අනාවරණය කිරීම් වල වටිනාකම් වාර්තා කිරීමට බලපාන විනිශ්චයන් ඇස්තමේන්තු ගත කිරීම් හා උපකල්පන ඇති කර ගැනීමට අවශ්‍ය වේ. කෙසේ වුවද , උපකල්පන හා ඇස්තමේන්තු ගත කිරීම් පිළිබඳව අවිනිශ්චිතතාවයන් හේතුවෙන් , අනාගත කාල පරිච්ඡේදය තුළ වත්කම් හා වගකීම් වල ධාරණ වටිනාකමට ප්‍රමාණාත්මක ගැළපීම් කිරීමට සිදුවන ප්‍රතිඵල ලැබිය හැකිය. එම නිසා සැබෑ අත්දැකීම් හා ප්‍රතිඵල මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැකිය.

සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ඇතුළත් කිරීමේ ක්‍රියාවලියේ දී මූල්‍ය ප්‍රකාශන තුල වටිනාකම් හඳුනා ගැනීම සඳහා වඩාත් සැළකිය යුතු බළපෑමක් ඇති කරන පහත සඳහන් විනිශ්චයන් , තක්සේරු හා උපකල්පන කළමණාකරණය විසින් ගනු ලබයි.

### (අ) බදුකරණය

සමාගම ආදායම් බදු සහ අනෙකුත් බදු වලට යටත් වේ. ප්‍රවර්ථන බද්ද , විලම්භිත බද්ද සහ අනෙකුත් බදු සඳහා වන මුළු ප්‍රතිපාදනයන් නිශ්චය කිරීමේ දී ප්‍රමාණාත්මක විනිශ්චයන් අවශ්‍ය වන අතර , මේ සඳහා මූල්‍ය ප්‍රකාශන වල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අනුව අවශ්‍ය ගැලපීම් කිරීමේ දී සහ බදු නිශ්චය කිරීම සඳහා බදු වන ලාභය ගණනය කිරීමේ දී විසඳුම් ලැබීමට ඇති බදු නිර්දේශයන් ද අදාල කර ගත යුතුයි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාවේ දී අදාල වන බදු නීතීන් හි අර්ථකථනයන් පිළිබඳව යම් යම් අවිනිශ්චිතතාවයන් පැවතිණි

සමාගම වර්තමාන , විලම්භිත සහ වෙනත් බදු සඳහා වත්කම් හා වගකීම් හඳුනාගනුයේ අතිරේක බදු පවතීද යන තක්සේරුව මත වේ. අවසාන බදු ප්‍රතිඵලයේ වගකීම මූලික සටහන් වලින් වෙනස් වීමේ දී , එම වෙනස තීරණය කරන ලද කාලපරිච්ඡේදය තුළ ආදායම් , විලම්භිත සහ බදු වටිනාකමට බලපානු ලබයි.

## (ආ) රාජ්‍ය භාගය මුදල් ගෙවීම

සමාගම විසින් ත්‍රෛමාසික පදනමින් භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය වෙත කැනීම් කරන ලද නිමැවුමේ ( කම්හල් නිෂ්පාදනය ) එහි තීරණය කළ වෙළඳපල වටිනාකමෙන් 7% ක් ගෙවීමට බැඳී සිටී. 2024/2025 වසර සඳහා මුළු මුදල රු. 86,742,430.00කි.

## (ඇ) දේපළ හා උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය

සමාගම සෑම වාර්තාකරණ දිනයකදීම වත්කම් වල අවශේෂ අගයන් , ප්‍රයෝජනවත් ආයු කාලය සහ ක්ෂය වීමේ ක්‍රම සමාලෝචනය කරයි. කළමණාකරණයේ විනිශ්චය , මෙම අගයන් , අනුපාත , ක්‍රම තක්සේරු කිරීමේ දී බලපාන අතර එබැවින් ඒවා අවිනිශ්චිතතාවයට යටත් වේ.

## (ඈ) අඛණ්ඩ පැවැත්ම

සමාගම විසින් සමාගමේ පවත්වාගෙන යාමේ හැකියාව නොහොත් අඛණ්ඩ පැවැත්ම තක්සේරු කරනු ලබන අතර ව්‍යාපාරය අනාගත අවිනිශ්චිත කාලයක් අඛණ්ඩව කර ගෙන යාමට අවශ්‍ය සම්පත් තිබේද යන්න පිළිබඳව සළකා බලයි.

- අමුද්‍රව්‍ය සැපයීම බාහිර කෙටි කාලීන ගිවිසුම් සහ අවිනිශ්චිත මූලාශ්‍ර මත රඳා පවතින අතර විකල්ප ඛනිජ නිධි හඳුනාගැනීම සඳහා පරියේෂණ හා කැනීම් සිදු කර නොමැත
- භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ඇස්තමේන්තු කර ඇත්තේ එප්පාවල සම්පූර්ණ නිධියේ රොක් පොස්පේට් මෙට්‍රික් ටොන් මිලියන 31 ක් ඇති බවයි.

කෙසේ වෙතත් , පතල් කැණීමේ අයිතිය ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් දීර්ඝ කාලීන ගිවිසුමක් නොමැති බැවින් අනාගතයේ දී පතල් කැනීම් කටයුතු සඳහා වෙනත් පාර්ශවයන්ද ඇතුළත් වීමේ හැකියාව පවතී. කෙසේ වෙතත් , මේ වන විට එවැනි අවිනිශ්චිතතාවන් කිසිවක් අධ්‍යක්ෂ මණ්ඩලය නොදකින අතර , එබැවින් මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව ක්‍රියාත්මක වන පදනම මත සකස් කරනු ලැබේ.

## (ඉ) ශේෂ පත්‍ර දිනට පසු වීම

2025 මාර්තු 31 වන විට සමාගමේ ප්‍රතිඵල කෙරෙහි සැළකිය යුතු බළපෑමක් ඇති කළ හැකි , ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් කිසිවක් වාර්තා වී නොමැත.

## (ඊ) මූල්‍ය වත්කම් මත හානිකරණ අලාභ

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හානිකරණ අලාභ වාර්තා කිරීම සඳහා යම් කිසි හරයාත්මක සාක්ෂි පවතීද යන්න පිළිබඳ සෑම වාර්තාකරණ දිනයකදීම හෝ නිරන්තරව සමාගම විසින් ඇගයීමක් සිදු කරයි.

## (උ) විකිණීම සඳහා පවතින ආයෝජනවල හානිකරණය

සමාගම විසින් සෑම වාර්තාකරණ දිනයකදීම විකිණීම සඳහා පවතින ආයෝජන ලෙස හඳුන්වන කොටස් අරමුදලට ලබා දී ණය හානිකරණය වී ඇති ද යන්න විමර්ශනය කරයි. සියළුම ණය සහ තැන්පතු සඳහා සමාන තක්සේරු ක්‍රියාවලියක් යොදා ගත යුතුය.

## (ඌ) විලම්බිත බදු වත්කම්

විලම්භිත බදු වත්කම් හඳුනාගනුයේ යම් ප්‍රමාණයකට භාවිතා නොකළ බදු අලාභ සහ බදු බැර පවතින බදු අය කළ හැකි ලාභයට එරෙහිව භාවිතා කළ හැකි නම් පමණි. අනාගත බදු සැළසුම් කිරීමේ උපාය මාර්ග සමඟින් අනාගත බදු අය කළ හැකි ලාභයේ විය හැකි කාලය සහ මට්ටම මත පදනම්ව , හඳුනාගත හැකි කල් දැමූ බදු වත්කම් ප්‍රමාණය තීරණය කිරීමට සැළකිය යුතු කළමණාකරණ විනිශ්චයන් අවශ්‍ය වේ.

## (එ) නිශ්චිත ප්‍රතිලාභ සැළසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් වල ප්‍රමිත වටිනාකම ධාරණ අගය තීරණය කරනු ලබන්නේ ආයුගණක උපකල්පන සළකා බලන සූත්‍රයක් භාවිතා කරමින්ය. මෙහි අනාගතයේ සිදුවන සත්‍ය සංවර්ධනයන්ගෙන් වෙනස් විය හැකි විවිධ උපකල්පනයන් ඇතුළත් කිරීම මෙයට ඇතුළත් වේ. මෙහි ඇතුළත් වනුයේ වට්ටම් අනුපාත වල නිර්ණය කිරීම් , අනාගත වැටුප් වැඩිකිරීම් , සේවක පිරිවැටුම් අනුපාතය යනාදිය වේ. අගය කිරීමේ සංකිර්ණතාවය , පාදක වූ උපකල්පන හා එහි දිගු කාලීන ස්වභාවය හේතු කොට ගෙන මෙම උපකල්පන වල වෙනස් වීම නිශ්චිත ප්‍රතිලාභ සැළසුමකදී ඉතා සංවේ දී වේ.

සියළුම උපකල්පන සෑම වාර්තා කරන දිනයකදීම නිරීක්ෂණය කරනු ලබයි. යෝග්‍ය වට්ටම් අනුපාත තීරණය කිරීමේ දී නිශ්චිත ප්‍රතිලාභ බැදියාව බලාපොරොත්තු වන කාලයට යෝග්‍ය වන තක්සේරු කරන කල් පිරීම සමඟ ශ්‍රී ලංකා රාජ්‍ය බැඳුම්කරණ ප්‍රතිලාභ කළමණාකරණය විසින් සළකා බලනු ලබයි. සමාගමේ අපේක්ෂිත අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතය සහ අනාගත අපේක්ෂිත උද්ධමන අනුපාතය මත අනාගත වැටුප් වැඩිවීම තීරණය කරයි.

## 4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් වල සාරාංශය

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී සමාගම විසින් යොදා ගනු ලබන සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත සඳහන් වේ. විශේෂයෙන් සඳහන් නොවන්නේ නම් , පහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අඛණ්ඩව සියළුම කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී යොදා ගනු ලබයි.

### 4.1 ආදායම් හඳුනා ගැනීම

### 4.1.1 භාණ්ඩ විකුණුම්

පහත සඳහන් සියළුම කොන්දේසි සම්පූර්ණ කරන විට භාණ්ඩ විකුණුම් වලින් ආදායම හඳුනා ගනී.

- ගැණුම්කරුවන් කොන්ත්‍රාත්තුව අනුමත කර ඇති විට ( ලිඛිතව , වාචිකව හෝ වෙනත් ව්‍යාපාර පිළිවෙත් වලට අනුකූලව ) සහ ඔවුන්ගේ වගකීම් ඉටුකිරීමට කැපවී සිටින අවස්ථාවක,
- භාණ්ඩ සහ සේවා මාරුවන අවස්ථාවේදී සෑම පාර්ශවයකම අයිතීන් හඳුනාගත හැකි අවස්ථාවක
- භාණ්ඩ සහ සේවා මාරුවන අවස්ථාවේ දී සෑම පාර්ශවයකම දැරූ පිරිවැය හඳුනාගත හැකි අවස්ථාවක,
- ගිවිසුම වාණිජමය මුහුණුවරක් ගන්නා අවස්ථාවකදී,
- පාරිභෝගිකයා වෙත මාරු කරනු ලබන භාණ්ඩ හා සේවා සඳහා හුවමාරු වටිනාකම සමාගමට එකතු කර ගැනීමට ඉඩ ඇති විට

### 4.1.2 පොළී ආදායම

ස්ථාවර තැන්පතු සහ කෙටි කාලීන ආයෝජන (REPO) වලින් ලැබෙන පොළී ආදායම සැබෑ පොළී අනුපාතය භාවිතා කරමින් උපචිත පදනම මත හඳුනා ගැනේ. කෙසේ වෙතත් , කාර්ය මණ්ඩල ණය වලින් ලැබෙන පොළී ආදායම සිදු වූ විට සැබෑ පදනම මත හඳුනා ගැනේ.

### 4.1.3 ලාභාංශ ආදායම

ලාභාංශ ආදායම හඳුනාගනු ලබන්නේ ලාභාංශ ලද විට , විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ සැබෑ පදනම මතය ( ශුද්ධ ආදායම)

### 4.1.4 වෙනත් ආදායම

වෙනත් ආදායම් ලද විට, සැබෑ පදනම මත හඳුනාගනු ලබයි.

### 4.2 වියදම් හඳුනාගැනීම

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ වියදම් හඳුනාගනු ලබන්නේ දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම ඉපැයීම අතර ඍජු සම්බන්ධයක් මතය. ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී සහ දේපල , පිරියත සහ උපකරණ කාර්යක්ෂමව පවත්වාගන යාම සඳහා දරණ සියළුම වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙන් අයකරනු ලැබේ.

ව්‍යාපාරය කර ගෙන යාමේ දී ඇතිවන සියළුම වියදම් සහ දේපල, පිරියත උපකරණ ඵලදායී ආකාරයෙන් පවත්වාගෙන යාම තුළ ඇතිවන අයකර ගැනීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී. ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණින් , සමාගමේ කාර්යය සාධනයේ සාධාරණ අගය ඉදිරිපත් කිරීමේ පදනම මත " වියදම් ශ්‍රිත " ක්‍රමය පවත්වාගෙන යයි. ආදායම් බදු වියදම් තුළ ජංගම හා විලම්භිත බදු ඇතුළත් වේ. ආදායම් බදු වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනී.

## 4.3 බදු

### 4.3.1 ජංගම බදු

ජංගම බදු වත්කම් හා වගකීම් තුළ ප්‍රවර්ථන වර්ෂය සඳහා දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාල්ගෙන් අයවිය යුතු හෝ ගෙවිය යුතු සහ පෙර වසර සඳහා ගැලපීමක් සිදු කළ යුතු නම් එය ඇතුළත් වේ. වාර්තාකරණ දිනට නීතිගත කර ඇති හෝ ඊට පසුව නීතිගත කර ඇති බදු නීති සහ බදු අනුපාත යොදා ගනිමින් වටිනාකම ගණනය කරනු ලබයි.

### 4.3.2 විලම්භිත බදු

විලම්භිත බදු පනවනු ලබන්නේ මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා බදුවල ධාරණ අගය සහ වත්කම් සහ වගකීම් වල බදු පදනම අතර වාර්තාකරණ දිනට පවතින තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමය යොදා ගනිමිනි.
සියළුම අඩුකළ හැකි වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කම් හඳුනා ගනී. භාවිතා නොකරන බදු බැර වල ඉදිරියට ගෙන යාම සහ භාවිතා නොකළ බදු අලාභ යම් ප්‍රමාණයකට අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් පවතින බදු අය කළ හැකි ලාභයට එරෙහිව ලබා ගත හැකි බව හෝ භාවිතා නොකළ බදු අලාභ හා භාවිතයට නොගත් බදු ගෙවීම් භාවිතා කළ හැකි විය යුතුයි.

සෑම වාර්තාකරණ දිනකටම විලම්භිත බදු වත්කමේ ධාරණ අගය විමර්ශනය කරනු ලබන අතර , විලම්භිත බදු වත්කමේ මුල් අගය හෝ කොටසක් ප්‍රමාණවත් බදු අය කළ හැකි ලාභයෙන් තවදුරටත් යම් ප්‍රමාණයක් දක්වා අඩු කරනු ලබයි. හඳුනා නොගත් විලම්භිත බදු වත්කම් සෑම මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයකම නැවත අගය කරනු ලබන අතර , අනාගත බදු අය කළ හැකි ලාභය , විලම්භිත බදු වත්කම ආවරණය කර ගැනිමට ඉඩදේ නම්, තවදුරටත් යම් ප්‍රමාණයකට හඳුනාගත හැකිය. විලම්භිත බදු වත්කම හා වගකීම් , නීතිගත කරන ලද හෝ පසුකාලීනව නීතිගත කරන ලද , බදු නීතිරීති සහ බදු අනුපාතවලට අනුව වත්කම් හඳුනා ගැනීම හෝ වගකීම් නිරාකරණය කර ගත් විට වර්ෂය තුළ යොදා ගැනීමට අපේක්ෂා කරන බදු අනුපාතයට අගය කරනු ලබයි.
විලම්භිත බදු වත්කම් සහ වගකීම් මනිනු ලබන්නේ වත්කම් සාක්ෂාත් කරගත් හෝ වගකීම් පියවන වර්ෂයේ අදාල වීමට අපේක්ෂා කරන බදු අනුපාතයට අනුව, බදු අනුපාත සහ වාර්තා කරන දිනයේ පනවන ලද හෝ පසුව පනවන ලද බදු නීතිමය මත පදනම්වය.

## 4.4 මූල්‍ය නොවන වත්කම

### 4.4.1 දේපල, පිරියත සහ උපකරණ

#### හඳුනාගැනීම සහ මැනීම

වත්කම් ආශ්‍රිතව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරයට ගලා ඒමේ ප්‍රවණතාවක් පවතී නම් සහ වත්කමේ පිරිවැය LKAS 16 දේපල, පිරියත හා උපකරණ ප්‍රමිතියට අනුව විශ්වාසදායීව මැනිය හැකි විට දේපල සහ උපකරණ හඳුනාගනු ලබයි. මූලිකව, දේපල , පිරියත හා උපකරණ පිරිවැයට ගිණුම් කරයි.

### පිරිවැය ආකෘතිය

දේපල සහ උපකරණ දෛනික සේවා පිරිවැයන් සහ සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරන වටිනාකම අඩුකර පිරිවැයට හෝ ප්‍රත්‍යාගණන අගයට ප්‍රකාශ කරනු ලබයි. හඳුනා ගන්නා ලද උපමානයන් හමුවුනහොත් ප්‍රතිස්ථාන පිරිවැය එම පිරිවැය දැරූ විට එම පිරිවැය ඇතුළත් කරයි.

### පසුකාලීන පිරිවැය

පසු කාලීන පිරිවැය ඇතිවනුයේ ව්‍යාපාරය පවත්වාගෙන යාමේ හෝ වත්කම් ඉපැයීමේ හැකියාව වර්ධනය කිරීමේ අදහසින් පසු කාලීනව දරන ලද ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම් , දීර්ඝ කිරීම හෝ වැඩි දියුණු කිරීම් වන අතර , මේවා ප්‍රාග්ධන වියදම් ලෙස සැළකේ. එවැනි වියදම් වත්කමේ ධාරණ අගය තුළ හඳුනා ගනී. දේපළ , පිරියත උපකරණ වල දෛනිකව ඇතිවන සේවාවල පිරිවැය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනියි.

### ක්ෂය වීම්

සරල මාර්ග ක්‍රමය භාවිතා කොට දේපල සහ උපකරණ වල පිරිවැය සුන්බුන් අගය දක්වා ඵලදායී ජීවිතකාලය පුරා ලිය හරිමින් ක්ෂය වීම් ගණනය කරයි. මිලදී ගැනීමේ දිනයේ සිට අත්තිකාරම් පදනම මත ඉවත් කිරීම දක්වා ක්ෂය වීම සිදු කරයි. ඉඩම් ක්ෂය නොකරයි.

තක්සේරු කරන ලද ඵලදායී ජීවිත කාලය මත ක්ෂය අනුපාත පහත දැක්වේ.

| වත්කම් වර්ගය | ක්ෂය ප්‍රතිශතය (%) |
|---|---|
| ගොඩනැගිලි | 04 |
| පිරියත හා යන්ත්‍ර | 10 |
| විදුලි උපකරණ | 10 |
| රසායනාගාර උපකරණ | 10 |
| මෝටර් වාහන | 20 |
| කාර්යාල උපකරණ | 20 |
| ලීබඩු හා සවිකිරීම් | 20 |
| විදුලි අලිවැට | 20 |
| පරිගණක දෘඩාංග හා මෘදුකාංග | 20 |
| ඉඩම් සහ ඉඩම් වැඩි දියුණු කිරීම ( අභ්‍යන්තර මාර්ග) | 05 |

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම දේපල , පිරියත හා උපකරණවල සුන්බුන් අගය, ඵලදායී ජීවිත කාලය හා ක්ෂය කිරීමේ ක්‍රමය සළකා බලන අතර ඒ සඳහා සංශෝධනයක් අවශ්‍ය නම් සිදු කරනු ලබයි. තාක්ෂණික වෙනස් වීමක් මත හෝ වෙනයම් හේතුවක් මත කිසියම් වත්කමක වටිනාකම සැළකිය යුතු ලෙස වෙනස් වන්නේ නම් අදාල අයිතමයේ ස්වභාවය හා වටිනාකම මත ක්ෂය කිරීම ගැලපෙන අනුපාතයට සිදු කිරීම හෝ සමාගමේ ලාභයට එරෙහිව කපා හැරීම සිදු කළ යුතුයි . ( උදා :- ජංගම දුරකතන , කැමරා)

දේපල පිරියත සහ උපකරණ වලට රු. 114, 449, 373 .78 ක්වූ සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති, එහෙත් තවමත් භාවිතයේ පවතින අගයක් ඇතුළත් වේ. ( මෝටර් වාහන රු. 95,515,000 /-, කාර්යාල උපකරණ රු. 6, 490, 565 /- , ගෘහ භාණ්ඩ හා සවි කිරීම් රු. 7,314,203 /- , පරිගණක දෘඩාංග සහ පරිගණක මුද්‍රණාංග රු. 4,129,605 /- )

### ප්‍රති හඳුනා ගැනීම

දේපල , පිරියත හා උපකරණ භාවිතා කිරීමෙන් හෝ විකිණීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ නොමැති නම් ඒවා හඳුනානොගනී. වත්කම් ප්‍රති හඳුනා ගැනීම මත ඇති වන ලාභය හෝ අලාභය ( ශුද්ධ විකුණුම් වටිනාකම සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරයි. ) වත්කම් ප්‍රති හඳුනා ගැනීම වර්ෂය තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ “ වෙනත් මෙහෙයුම් ආදායම ” යටතේ හඳුනා ගනු ලබයි.

### 4.4.2 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සමාගම විසින් සෑම ගිණුම් කාලච්ඡේදයක් අවසානයේදී ම එහි වත්කම්හි හානිකරණය සිදු කිරීම සඳහා ඇඟවීමක් ඇත්ද යන්න පිළිබඳ විවරණයක් සිදු කරයි. කිසියම් ඇඟයීමක් පවතින්නේ නම් , හෝ වත්කමක් සඳහා වර්ෂික හානිකරණ පරීක්ෂාවක් අවශ්‍ය වන විට , සමාගම විසින් වත්කමේ නැවත අයකර ගත හැකි අගය ඇස්තමේන්තු කරයි.

### 4.5 මෙහෙයුම් කල්බදු

කල්බදු හිමියා විසින් කල් බදු කාලය පුරා අයිතියේ ප්‍රතිලාභ සහ සියළුම පසුකාලීන අවදානම් ඵලදායීව රඳවා ගනී නම් එවැනි බදු, කල් බදු ලෙස වර්ගීකරණය කරයි. මෙහෙයුම් කල් බදු ගෙවීම කල් බදු කාලය පුරා සරල මාර්ග ක්‍රමයට වියදමක් ලෙස හඳුනාගැනීම හෝ කල් බදු වත්කම් භාවිතා කිරීමෙන් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ ගලා එන කාල පිළිවෙලේ නිරූපනය මත හඳුනාගනු ලබයි.

### 4.6 තොග

සාමාන්‍ය තොගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධක අගය යන අගයන් වලින් අඩු අගයට ප්‍රකාශ කරයි. නිෂ්පාදන පිරිවැය මත පදනම්ව හරිත සාමාන්‍ය පදනම මත පිරිවැය හඳුනාගනී. පොස්පේට් තොග අගය කරන විට කැනීම් පිරිවැයෙන් 40%ක් ඇඹරුම් ( සකස් නොකළ) නිෂ්පාදනයට ද ඉතිරි 60% සකස් කළ නිෂ්පාදනයට ද විභජනය කිරීම භාවිතයේ පවතී. ශුද්ධ උපලබ්ධි අගය වනුයේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී විකිනීමට තබා ඇති තොගවල වටිනාකමින් ඒ සඳහා අවශ්‍ය විටදී දරනු ලබන උපලබ්ධි වියදම් අඩු කිරීමෙන් පසු ලැබෙන අගය වේ. යල් පැන ගිය , සෙමින් සංචලන සහ දෝෂ සහිත තොග සඳහා අවශ්‍ය වෙන් කිරීම සිදු කරනු ලබයි.

### 4.7 මූල්‍ය වත්කම් හඳුනාගැනීම සහ මැනීම

ප්‍රවර්ථන වර්ෂය තුළදී ක්‍රමක්ෂය පදනම මත හඳුනාගත් මූල්‍ය වත්කම් වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත් සාධාරණ අගය හෝ ලාභ අලාභ ප්‍රකාශය තුළ හඳුනාගත් සාධාරණ අගය පහත පදනම් දේ මත වර්ග කරනු ලබයි.

අ) මූල්‍ය වත්කම් කළමනාකරණ සඳහා සමාගමේ ව්‍යාපාරික ආකෘතිය

ආ) මූල්‍ය වත්කම් වල ගිවිසුම් මූල්‍ය ප්‍රවාහ ලක්ෂණ

පහත කොන්දේසි දෙකම සපිරේ නම් මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පදනම හඳුනාගත හැකිය.

අ) ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කර ගැනීම සඳහා ව්‍යාපාර පරිචය තුළ පවත්නා මූල්‍ය වත්කම්

ආ) මූලික ගෙවීමක් හෝ හිඟ ප්‍රධාන මුදල මත ගෙවනු ලබන පොළිය මගින් නිශ්චිත දිනකදී මුදල් ප්‍රවාහය ඉහළ නංවන මූල්‍ය වත්කම්

පහත කොන්දේසි දෙකම සැපිරේ නම් , වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළින් හඳුනාගන්නා සාධාරණ අගයට මූල්‍ය වත්කම් මනිනු ලබයි.

අ) ගිවිසුම් ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීමේ අරමුණෙන් ව්‍යාපාර පරිචය තුළ පවත්නා මූල්‍ය වත්කම්

ආ) මූලික ගෙවීමක් හෝ හිඟ ප්‍රධාන මුදල මත ගෙවනු පොළිය මගින් නිශ්චිත දිනකදී මුදල් ප්‍රවාහය ඉහළ නංවන මූල්‍ය වත්කම්

## 4.8 මුදල් හා ශේෂ බැංකු

මුදල් සහ බැංකු ශේෂයන් අර්ථ දක්වා ඇත්තේ අතේ ඇති මුදල් සහ බැංකු සමඟ ඇති ශේෂයන් ලෙසය. මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අරමුණ සඳහා , මුදල් සහ මුදල් සමාන දෑ අතේ අතේ ඇති මුදල් සහ බැංකු තැන්පතු වලින් , බැංකු අයිරා වටිනාකම අඩු කිරීමෙන් පසුව වේ.

සමාගම, ලංකා බැංකුවේ ග්‍රෑන්ඩ්පාස් ශාඛාවෙන් රුපියල් මිලියන 70.0 ක ස්ථිර බැංකු අයිරා පහසුකම ලබා ගෙන ඇත. ( මේ සඳහා ස්ථාවර තැන්පතු අංක 00089022366 ආරක්ෂාවට තබා ඇත ) කෙසේ වෙතත් , ඉන් භාවිතා කළ මුදල 2025.03.31 වන විට ශුන්‍යව පැවතුණි.

## 4.9 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස් , හිමිකම් ලෙස වර්ග කරයි. හිමිකම් සාධන පත්‍ර , මුදලේ සාධාරණ අගයට හෝ වෙනත් වත්කම් ලැබීම හෝ ලැබිය යුතු දෑ , හිමිකම් සාධන පත්‍ර නිකුත් කිරීමේ ඍජු ශුද්ධ පිරිවැයට මනිනු ලබයි.

## 4.10 විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාව

### 4.10.1 නිශ්චිත ප්‍රතිලාභ සැළසුම - පාරිතෝෂික

සමාගම 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත අනුව පාරිතෝෂික ගෙවීමට බැඳී සිටී. පාරිතෝෂික ගෙවීම සඳහා අඛණ්ඩව අවුරුදු 05 ක සේවා කාලයක් සම්පූර්ණ විය යුතුය. එම පනත යටතේ සමාගමේ වගකීම, “ Projected Unit Credit Method ” ක්‍රමය යටතේ ආයුගණක තක්සේරුකරුවෙකු විසින් අදාල උපකල්පන මත ගණනය කරනු ලැබේ. උපකල්පන හා ක්‍රමවේදය මත ගණනය කළ සේවකයින්ගේ 2025 මාර්තු 31 දිනට විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාව මත වූ වර්තමාන අගය රු. 87,715,428 /- කි. එමෙන්ම විශ්‍රාම ප්‍රතිලාභ මත වූ වර්තමාන අගය 2024 මාරුතු 31 දිනට රු. 60,365,049/- ක් විය. එම වගකීම බාහිර අරමුදලක් ලෙස ලංකා බැංකුවේ ග්‍රෑන්ඩ්පාස් ශාඛාවේ ස්ථාවර තැන්පතුවක් ලෙස පවතී . වර්ෂ අවසාන වන විට එම ස්ථාවර තැන්පතුවේ වටිනාකම රු . 148,493,527/- (0089022357 ) කි. එක් එක් වර්ෂ අවසානයේ දී හඳුනාගත් වගකීම් අනුව වාර්ෂිකව ආයෝජනය කරනු ලබන මුදල සමාලෝචනය කෙරේ.

### 4.10.2 නිශ්චිත දායක සැළසුම

නිශ්චිත දායක සැළසුමක් යනු වෙනමම ඒකකයක් තුළ ස්ථිර දායකයක් ගෙවන සහ අමතර වටිනාකම් ගෙවීමට නීතිමය හෝ නිර්මාණාත්මක බැඳියාවක් නොමැති පසු සේවක ප්‍රතිලාභ සැළසුමකි. නිශ්චිත දායක සැළසුම් දායකත්වය සඳහා බැඳියාව හඳුනාගනු ලබන්නේ සේවකයා සේවය කරන කාලය තුළ , විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සේවක ප්‍රතිලාභ වියදම් වශයෙන්ය.

#### අ) සේවක අර්ථසාධක අරමුදල

අනුමත අර්ථසාධක අරමුදලට සෑම සේවකයෙකුගේම වැටුප මත සමාගමේ හා සේවකයාගේ දායකත්වය පිළිවෙලින් 12% සහ 10% වශයෙන් වේ.

#### ආ) සේවක භාරකාර අරමුදල

සමාගම විසින් සෑම සේවකයෙකුගේම වැටුප මත 3% ක දායකත්වයක් සේවක භාරකාර අරමුදලට යොදයි.

## 4.11 මූල්‍ය වගකීම්

පහත සඳහන් (අ) සහ (ආ) හැර සමාගම සියළු මූල්‍ය වගකීම් පසුව ක්‍රමක්ෂය කළ පිරිවැයෙන් මනින පරිදි වර්ගීකරණය කරයි.

අ) මූල්‍යමය වගකීම් වල ලාභය හෝ අලාභය මත තීරණය කරනු ලබන සාධාරණ අගය

ආ) මූල්‍ය වත්කම් ප්‍රති හඳුනාගැනීමක් සඳහා සුදුසුකම් නොලබන විට හෝ අඛණ්ඩව සහභාගීත්ව ප්‍රවේශය අදාල වන විට පැන නගින මූල්‍ය වගකීම්.

## 4.12 වෙන් කිරීමේ ප්‍රතිපාදන

වෙන් කිරීම් හඳුනාගනුයේ සමාගමේ අතීත සිදුවීමක ප්‍රතිපලයක් ලෙස වර්තමාන බැදියාවක් ( නීතිමය හෝ නිර්මාණාත්මක ) පවතින විට සහ බැදියාව නිරාකරණය කිරීමේ දී ආර්ථික ප්‍රතිලාභ ජනිත කරන සම්පත් පිටතට ගලා යාමේ හැකියාවක් පවතින හා බැදීම විශ්වාසදායකව මැනිය හැකි විටදීය. ඕනෑම වෙන් කිරීමකට අදාල වියදම් ප්‍රතිපූර්ණයන් අඩු කළ පසු වටිනාකම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ ඉදිරිපත් කරනු ලබයි.

## 4.13 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

LKAS 07 - මුදල් ප්‍රවාහ ප්‍රකාශය , යන ප්‍රමිතයේ නියමයන් අනුකූලව වක්‍ර ක්‍රමය යොදා ගනිමින් සකස් කර ඇත . මුදල් හා මුදල් සමාන දෑ වල අතැති මුදල් , බැංකු මුදල් සහ බැංකු අයිරා අඩංගු වේ.

## 4.14 ආංශික තොරතුරු

අංශයක් / කාණ්ඩයක් යනු සේවා සැපයීම තුළ නියැලෙන , වෙන්ව හඳුනාගත හැකි අංශයක් වන අතර අනෙකුත් අංශයන්ගෙන් වෙන්ව අවධානම් සහ ප්‍රතිලාභ වලට හිමිකම් කියනු ලබයි. සමාගමට වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ඇති අංශයක් / ඛණ්ඩයන් නොමැත.

## රැස්වීම් පිළිබඳ දැණුම් දීම

සී /ස ලංකා පොස්පේට් සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2025 නොවැම්බර් මස 27 වන දින පස්වරු 3.30 ට කොළඹ 14, නව කැළණි පාලම පාර , අංක 73 1/1 දරණ ස්ථානයේ පිහිටි ප්‍රධාන කාර්යාලයේ දී පහත කාරණා සඳහා පවත්වන බව කොටස්කරුවන්ට මෙයින් දැණුම් දෙමි.

1. 2007 අංක 07 දරන සමාගම් පනතේ 144 වන වගන්තියේ විධිවිධාන අනුව (සංශෝධිත පරිදි) පවත්වන ලද අවසන් වාර්ෂික මහා සභා රැස්වීමේ වාර්තා තහවුරු කිරීම සඳහා

2. 2025.03.31 න්අවසන් වූ වසර සඳහා විගණනය කළ ගිණුම් ප්‍රකාශය හා 2025.03.31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය හා විගණකාධිපති වාර්තාව මෙහි සඳහන් කර ඇත.

3. මේ සමඟ එවනු ලබන වාර්ෂික වාර්තාව ලැබීම සහ අනුමත කිරීම

4. මහා භාණ්ඩාගාරයට සමාගමේ එකම කොටස්කරු ලෙස 2024/2025 වර්ෂය සඳහා ලාභාංශ බෙදා හැරීම අනුමත කිරීම

5. සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 92 සහ 93 වන වගන්ති ප්‍රකාරව ( වාර්ෂිත මහා සභා රුැස්වීමේ දී ) විශ්‍රාම යන අධ්‍යක්ෂවරුන් සහ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 94 වගන්තිය යටතේ නැවත තේරි පත්වීම.

6. 2025/2026 වර්ෂය සඳහා විගණක ලෙස විගණකාධිපතිවරයා ප්‍රකාශයට පත් කිරීම.

7. දැනුම් දී ඇත. අනෙකුත් දේ.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය මත ,**

**එච් එල් විපුල එස් ඊ සිල්වා ( නීතීඥ)**

**සී / ස ලංකා පොස්පේට් සමාගමේ ලේකම්වරුන්**

**සටහන්**

මහා සභා රැස්වීමේ දී කොටස්කරුවෙකුට ඔහු වෙනුවෙන් ඡන්දය දීමට , ඔහු / ඇය වෙනුවෙන් ඡන්දය පාවිච්චි කිරීමට සහ පැමිණීමට ප්‍රතියුක්තකයෙකු පත් කිරීමට හිමිකම් තිබේ. ප්‍රතියුක්තකයා සමාගමේ සාමාජිකයෙකු වීම අවශ්‍ය නැත. මෙම අරමුණ සඳහා ආකෘති පත්‍රය අමුණා ඇත.

පෙර කලාසියේ ආකෘතිය

**සී / ස ලංකා පොස්පේට් සමාගම**

## බලපත්‍රය

.................................................................. පදිංචි ...................................................... වන , මම / අපි ඉහත සඳහන් සමාගමේ සාමාජිකයෙකු වීම හේතුවෙන් ...................................................... පදිංචි ........................................හෝ ඔහු / ඇය අසමත් වුවහොත් ............................................................ පදිංචි ........................................................යන අය මගේ / අපගේ බලය ලත් නියෝජිතයා වශයෙන් 2025 නොවැම්බර් මස 27 වන දින සමාගමේ පැවැත්වෙන වාර්ෂික මහා සභා රැස්වීමේ දී සහ යම් කල් තැබීමකදී ද එයට ප්‍රතිඵලයක් වශයෙන් පැවැත්වෙන සෑම ඡන්ද රැස්වීමකදීම , අප / මා වෙනුවෙන් ඡන්දය දීමට මෙයින් පත් කරමි / කරමු.

2025 .................................. මස .................................. දිනයේදී අත්සන් කරන ලදී.

**අත්සන :-** ……………………………..

<u>සටහන</u>

- නියෝජිතයාට ඔහුට සදුසු යයි සිතෙන පරිදි රැස්වීමකදී ඉදිරියට ගෙනෙන ලද ඕනෑම යෝජනාවට ඡන්දය ප්‍රකාශ කිරීමට හැකිය.
- නියෝජිතයා සමාගමේ සාමාජිකයෙකු වීම අවශ්‍ය නැත.
- සම්පූර්ණ කිරීමට අවශ්‍ය උපදෙස් මෙහි පිටුපස සටහන් කොට ඇත.